භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

2020 මාර්තු - අප්‍රේල්

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2020 මාර්තු-අප්‍රේල් 121 වන කාණ්ඩය - 03 කලාපය පිටු 32 Q/D/03/පුවත්/2020



# එගොඩහා යන්නෝ....

ගේය පද - ඩෝල්ටන් අල්විස්
සංගීතය සහ ගායනය - ටී. ෂෙල්ටන් පෙරේරා

පුන ගැයුම : එගොඩහා යන්නෝ තව කවුරුද ඉන්නේ
මෙගොඩහා යන්නෝ තව කවුරුද ඉන්නේ
එගොඩහා යන්නෝ මෙගොඩහා යන්නෝ තව කවුරුද ඉන්නේ

පමා නොවන්නේ අඳුර වැටෙන්නේ
යනවා නම් එන්නේ //
මම මේ ගඟුලේ අඟුළේ නැගලා
එගොඩ මෙගොඩ යනවා

ගඟුල අනෝමයි අද මට වෙහෙසයි
යනවා නම් එන්නේ //
මම මේ ගඟුලේ අඟුළේ නැගලා
එගොඩ මෙගොඩ යනවා

ඒ කාංසිය මුසු ගැඹුරු ළසෝ බර
පිරිමි හඬ - හද ගැබ පසාරු කරගෙන මනස් පත්ලේ හිඳිමින්
දෝංකාර නගමින් එකම එක පැනයක්
ගිගුම් දෙමින් අසයි
"එගොඩහා යන්නෝ මෙගොඩහා යන්නෝ තව කවුරුද ඉන්නේ"
සකල මානව අධ්‍යාත්මයේ ඒකායන ශෝකජනක සුසුම්
වේගයේ සංවේදි රිද්මය මොනවට මුසු කරගන්නා ගීතය,
අප අධ්‍යාත්මය එතෙරවීමකට කැඳවයි
ආරාධනා කරයි.
ගඟුල අනෝමය - අඳුරු වැටෙමින් තිබේ
අඟුළද තිබේ - තොටියාද සිටී
එහෙත් අපි අඟුළ නොදකිමු - තොටියාද නොදකිමු
තොටියකු, ගඟුලක් - අඟුළක් රූපක කොට ගෙන
මේ ගීතය උපමා සපයන්නේ
විඩාබර ජීවිත අතෘප්තිකර මානව ස්වභාවය
අනන්තයෙන් මොරගා ඉල්ලා සිටින
"එතෙරවීමේ" මානව ස්වභාවය නොවේද?
අඟුළද තිබේ - තොටියාද සිටියි
එතෙර යන්නන්ට එතෙර යා හැක - මෙතෙර යන්නන්ට මෙතෙර යා හැක
අඳව බීරිව සිටින අපට, මේ උච්ච ස්වරෙන්
ආරාධනා කරන්නේ කවුද?
ඒ හඬ කාගේද ඔබේ අභ්‍යන්තරයෙන්ම අසන්න
ඒ හඬට ඇහුම්කන් දෙන්න

සංජය නිර්මාල්

# ශක්ති ප්‍රබෝධනය

2020 මාර්තු - අප්‍රේල් කලාපය


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අති ගරු අර්වින් එච්. මොරායස් නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සහාය සංස්කාරක**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**කාර්යාලයීය සහාය**

දිනේෂා රණවක

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

සිසිර විජේතුංග ග්‍රැෆික්ස්

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08


## පිටුවෙන් පිටුව.........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

4 එතෙරවීම ගැලවීමයි - පී.ඩී. රොහාන් අප්පුහාමි

7 ස්කූටරයෙන් එතෙර වීම - සචිත මෙන්ඩිස්

8 සොඳුරු වසන්තයේ අභියෝග
- ගරු ඇන්ජලා ප්‍රනාන්දු දයාවේ පැවිදි සොහොයුරිය

10 පසම් ඉතිහාසයෙන් බිඳක්
- ගරු අලංක බණ්ඩාර නි.ම.නි. සහෝදරතුමා

12 තීරණාත්මක මංසන්ධියක අපි
- අරුණ ශාන්ත නොනිස්

14 ලොකු හොරකම - වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු

15 අවසාන පැය - කේ. ඩේසි පෙරේරා

16 ස්වාමිනී, මොවුන් නොදැන කරන වරදට මොවුන්ට සමාව දුන මැනව
- කේ. ඒ. නිම්නාදි රොද්‍රිගෝ

17 කල්වාරි ගමන - අප දිවි ගමනයි
- බුද්ධික සඳරුවන්

18 පුංචි විකුම් - සූරිය මාමා

19 ප්‍රහේලිකා අංක 58
- ගරු ලක්මාලි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය ශු.ප.

20 ශුද්ධ වූ සණ්ටාව - ෆිලීෂන් අබයකෝන්
පැවිදි දිවිය - නෙහාසා සෙව්වන්දි

21 කැඳවීමක් තුළ කැඳවීමක් ලද නි.ම.නි. පියතුමා
- ගරු ප්‍රදීපිකා පැවිදි සොහොයුරිය ජ.නි.

22 මහ බ්‍රහස්පතින්දා සිදු වූ මහ සිදුවීම
- ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමා

23 ආදරයේ අවශ්‍යතාවය - සපුගස්කන්දේ රංජිත්

24 මීසම් සේවාව තුළින් අපි එතෙර වී ගැලවෙමු
- ගරු සුභාෂ් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා

26 අපේ ඇන්තෝ - ප්‍රේමකීර්ති ද අල්විස්
කාටූනය - සී. අමිත
ප්‍රහේලිකා අංක 56 ජයග්‍රාහකයෝ

27 නිදහස් අහසක් නිදහස් පොළවක්
- මහින්ද නාමල්


28 ඕං එහෙනං - සූරිය මාමා

29 කතෝලික ධර්මය, අ.පො.ස. (සා/පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2020
- ජේ.ඒ.එල්.එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය

31 ලක්දිව ක්‍රිස්තු ශාසනය (VIII) / අ.පො.ස. (උ/පෙ.) ක්‍රිස්තියානි ධර්මය - ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි
- එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛන්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

"එගොඩහා යන්නෝ මෙගොඩහ යන්නෝ තව කවුරුද ඉන්නේ"ඩෝල්ටන් අල්විස් සූරීන් විසින් පද මාලාව සකසන ලද ගීතයේ දිසි අරුතය (වචනයේ තේරුම) එකක් වුවද, වැසි අරුතය (යටි අදහස) විවිධ අයුරින් අර්ථ කථනය වෙයි. ඒ අනුව ගත් කල "එගොඩ" ලෝකෝත්තර ජීවිතය ලෙසද, "මෙගොඩ" මෙලොව ජීවිතය ලෙසද කිතුනු ඇසින් දැකිය හැකිය. අපගේ සමිඳාණන් වහන්සේ ලෝකයේ ආලෝකයයි. ආලෝකය නැති තැන ඇත්තේ අඳුරකි. පාපය නැමැති අඳුරින් අපව ගලවන්නේ ක්‍රිස්තුස් වහන්සේය. ගංගාවේ ඇති මහා ජල කඳින් එතෙර වන්නට, අඳුර වැටෙන්නට කලින් එන ලෙස තොටියා ජනයාට ආරාධනා කරයි. එලෙසම පාපය නැමැති අඳුරින් වෙලෙන්නට ප්‍රථම මේ ලෝකය නැමැති මහා ජල කඳින් එතෙර වන්නට ක්‍රිස්තු පාරුවට ගොඩවන ලෙස උන්වහන්සේ ඔබට මට ආරාධනා කරන සේක. එලෙස අඳුරින් ආලෝකයට එතෙර වී ගැලවෙන්නට කවරයේ කථාව පාඨකයන්ට ආරාධනා කරයි.

## භක්ති ප්‍රබෝධනය

**දායකත්වය එක් වසරකට - රු.500.00**
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

**දායකත්වය සය මසකට - රු.250.00**
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
**භක්ති ප්‍රබෝධනය**
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 011 2698177
නව විද්‍යුත් තැපැල (ඊ-මේල්) :
bhakthi.prabodhanaya@gmail.com

## BHAKTHI PRABODHANAYA

**Local Subscription Rate.**

**Rs. 500.00 per year** (Including Postage)

**Rs. 250.00 per six months**
(Including Postage)

Letters, subscriptions and inquires should be addressed to:

Editor.
**"Bhakthi Prabodhanaya"**
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka.
Tel.: (94) 011-2698177
New Email: bhakthi.prabodhanaya@gmail.com

# එතෙර වී ගැලවෙමු....

එදා ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ පාරාවෝ රජවරුන්ගේ ආධිපත්‍යය යටතේ දහදුක් විඳිමින් වහල්ලු ලෙස ජීවත් වූහ. විමුක්තිය පතා ඔවුන් මොරගැසූ සඳ ඒ මොරගැසීම දෙවියන් වහන්සේ වෙත පැමිණිනි. දෙවියන් වහන්සේ මෝසෙස්ගේ මැදහත්කමින් පාරාවෝ ගෙන් ජනතාව මුදා රතු මුහුදින් එතෙර කර ඊශ්‍රායෙල් ජනතාව ගලවා ගත් සේක. දෙවියන් වහන්සේ කළා වූ ඒ ඓතිහාසික ගැලවීමේ ආශ්චර්යය පරම්පරාවෙන් පරම්පරාවට අනුස්මරණය කරමින් ඒ ජනතාව සිය ඇදහිල්ලේ තව තවත් ශක්තිමත් වූහ. ඔවුහු වසරක් පාසා පාස්කු මංගල්‍යයේදී සිහිපත් කළේ ඒ විමුක්ති අත්දැකීමය.

නව ගිවිසුමේදී පැරණි පාස්කු පිළිවෙතට නව අරුතක් එක්වනුයේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කොන්දේසි විරහිත ප්‍රේමයේ පරිත්‍යාගී ජීවිතය සහ ගැලවීමේ මහා පූජාවීම හේතුකොටගෙනය. පාස්කු අභිරහස තුළ අපි සුපරිස්මරණය කරන්නේ උන්වහන්සේගේ දුක් විඳීම, මරණය සහ මරණය පරාජය කොට ජීවිතය විජයග්‍රහණය කිරීමේ නව එතෙර වීමයි.

පාරාවෝගේ ආධිපත්‍යට යටවුණු වහල්කමට වඩා භයානක වහල් කමක් අද අප අතර සිසාරා පැතිරී ඇත. තමන් අදහන ආගම්වල ධර්ම මාර්ග නොසලකා, වටිනාකම් උඩුයටිකුරු කරන ඇතැම් බංකොලොත් දේශපාලනඥයන්ගේ යටිකුට්ටු න්‍යාය පත්‍රවලට හසු වී, ඔවුන්ගේ අතකොලුවක්ව තම සහෝදර ජනතාවගේම අභිමානය කෙලෙසමින් සාරධර්ම හා වටිනාකම් විකෘත කරන උදවිය, මේ විනාශකාරී වහල්කමේ ප්‍රතිරූපයක් නොවේ ද? එමෙන්ම ජන සමාජයේ පිළිගත් මානව සම්බන්ධතා අවුල් කරමින් මුසාව සමාජගත කරන ඇතැම් රූපවාහිනී නාලිකා සහ සමාජ වෙබ් අඩවි හැසිරෙන්නේ තව තවත් මෙම වහල් මානසිකත්වයේ ගොදුරක් බවට පොදු ජනතාව පත් කරගෙන එමගින් වාසි ගැනීමටය. යන එන විට විශේෂයෙන්ම ආලෝක මාර්ග සංඥා සවිකර ඇති මංසන්ධියක් මංසන්ධියක් පාසා කුඩා දරු දැරියන් ඔසවාගෙන සිගමන් ඉල්ලන යාචකයන් දරුවන්ට ඕඩිකොලොන් පොවා ඔවුන්ව වඩාගෙන සිඟමන් ඉල්ලන බව අපට අසන්නට ලැබෙයි. මේ හානිකර ක්‍රියාව දරිද්‍රතාවට එහා ගිය කුට ව්‍යාපාරිකයන් විසින් ඔවුන්ට දමනු ලැබූ යාචක වහල්කමේ මාංචුවක් බව සක්සුදක් සේ පැහැදිලිය.

## හෙළිදරව්ව

යෞවනයේ සොඳුරු වසන්තය විඳිය යුතු තාරුණ්‍යය මේ තරම් වේගයෙන් මත් රකුසාට බිලිවීමේ ඛේදවාචකය තවත් වහල්කමක් නොවේද? ඔවුන්ගේ මව්පියෝ අද අසරණ වී සෝ සුසුම් හෙළති.

බලවත් රටවලින් ලැබෙන විදේශ ආධාර හරහා යැපෙන ආර්ථික රටාවකට හුරුවීමේ වහල්කම නිසාම ඒ රටවලින් මෙරටට එන සහ එවන රෝග වසංගත වලට ගොදුරු වන්නේ මිනිසුන් පමණක් නොව ශාක සහ සතුන් ය.

ඉතා ඉහළ ලකුණු මට්ටම් ලබාගෙන අධ්‍යාපනයේ ඉහළ ඉලක්ක කරා ගමන් කරන්නට පැතුම් පතාගෙන විශ්ව විද්‍යාලවලට ඇතුළු වන ඇතැම් ශිෂ්‍යශිෂ්‍යාවන්ට සමහර සහෝදර සිසුන්ගේ හැසිරීම් වේදනාකාරී කලකිරීමට පමණක් නොව මානසික රෝග පීඩාවලට ද ගොදුරු වීම කාට වැළැක්විය හැකි ද? පහත් වින්දනයක් විඳින්නට දියත්කර ඇති හිංසාකාරී ක්‍රියාකාරකම් සහ ඇතැම් අවස්ථාවලදී ගුටි බැට දක්වා ගමන් කරන හැසිරීම් හරහා මතු වන්නේ තම අතෘප්තිකර ආශාවලට සහ ආවේගශීලී හැඟීම්වලට ඔවුන් කොතරම් වහල් වී සිටින්නේද යන්න ය. සැබෑ දහම අවබෝධ කරගෙන විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව මේ භයානක වහල්කමින් එතෙර වී ගැලවෙන්නේ කවදා ද?

දහම් හරයට වඩා වත්පිළිවෙත්වලට මුල්තැන දීමට ජනතාව හුරුකරවන ආගමික නායකයින් ඕනෑම ආගමක දැකිය හැකිය. එමගින් බැතිමතුන් අන්ධ භක්තියේ වහල්කමට ඇදගෙන යනවා පමණක් නොව එවැන්නන් ද දැනුවත්ව හෝ නොදැනුවත්ව ලෞකික දෑවලට ඇලී ගැලී වෙළී ඒවායේ වහලුන් වීම නිසාම බැතිමතුන් සැබෑ දහම් ජීවිතයෙන් නිරායාසයෙන් ඉවත්වීම වහල්කමේ තවත් පැතිකඩක ඛේදවාචකයක් නොවන්නේ ද?

මෙවැනි වූ විවිධ වහල්කම් හරහා අඳුරටම ගමන් කරන හැමදෙනාටම අප සමිඳාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ආරාධනා කරන්නේ වහල් මානසිකත්වය නමැති අඳුරින් ආලෝකයට එතෙර වන්නටය.

අපත් එතෙර වී වහල්කමින් දිවි ගෙවන සොයුරු සොයුරියන් එතෙර කර ගලවන්නට දායක වීම මෙවර පාස්කුව ඔබට මට කරන අභියෝගයක් නොවන්නේ ද?

# එතෙරවීම ගැලවීමයි

නික්මයාම සිදුවීමේ උච්චතම අවස්ථාව රතු මුහුද මැදින් එතෙර වීම ලෙස සැලකිය හැකිය (නික්ම:14). මෙහිදී රතු මුහුද සඳහා භාවිත වන හෙබ්‍රෙව් වචනය වන්නේ "යම් සුෆ්" (Yam Suf) ය. එය දෙයාකාරයකින් අරුත් දැක්වේ. බට පඳුරු සහිත මුහුද (Sea of Reed) එක් අරුතකි. අවසාන මුහුද (Sea of the End) දෙවෙනි අරුතකි. සමහරුන් මෙම මුහුද පිළිබඳව හා එය දෙබෑ වීම පිළිබඳව විවිධ මත දැරුවත් වඩාත් සැලකිල්ලට භාජනය වන සාම්ප්‍රදායික මතය වන්නේ රතු මුහුද සමිඳුන්ගේ බාහු බලය හේතුකොටගෙන, පෙරදිගින් හැමූ සැඩ සුළඟක් මගින් දෙබෑ වී තාප්පයක් මෙන් දෙපස පිහිටි බවයි. එසේම මුහුද මැදින් පෑදුණු වියළි බිම මැදින් ඊශ්‍රායෙල් ජනතාව ගමන් කළ බවයි. මෙම සිදුවීම ඓතිහාසික දත්තානුසාරයෙන් පළකිරීමේදී විවිධ අදහස් ඉදිරිපත් වූවත් මෙහි දේවධාර්මික අර්ථය වඩාත් සැලකිය යුතුමය.

මිනිස් උපතක් භෞතිකව සිදුවන්නේ මේ හා සමානරූපිකවය. එනම් මව් කුසයේ සිටින දරුවා සුරක්ෂිත යැයි අත්දුටුවත් තමාට උරුම නිදහස් ලෝකයට පැමිණිය යුතුමය. එහිදී නව උපත ලබන්නේය. මව් කුස සීමිතය. සුරක්ෂිතභාවය නම් පැහැදිලිය. එහෙත් කාලය ද ඉතාමත් සීමිතය. නව උපත ලබන ලෝකය එතරම්ම සීමිත නැත. මන්ද ඉදිරි පැවැත්මට හා වර්ධනයට මව් කුස තුළින් නික්ම ආ යුතුව ඇත. එසේ තමාට උරුම නිදහස් ලෝකයට පැමිණෙන්නේ ගර්භාශයේ ග්‍රීවය හරහාය. මෙම ගැබ්ගෙල හා ඊශ්‍රායෙල් ජනතාවගේ රතු මුහුද මැදින් තමාට උරුම නිදහස් ලෝකයට නික්ම ඒම සමානරූපිකව දැකීම සෙමිතික රූපීකරණයට පටහැනි නොවේ. නව උපත බිළිඳුය. එබැවින් එය ආරක්ෂා කරගත යුතුය. එය වර්ධනය කළ යුතුය. එමෙන්ම මුහුකුරා යාමට පාත්‍ර විය යුතුය. මුහුකුරා ගැන්වීමට මව් පිය ගුරු දෙගුරුන් හට බඳුන් කළ යුතුය. එවිට එළදායී මිනිසෙක් බිහි වන්නේය. එලෙස ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවෙන් පොරොන්දු දේශය කරා නික්ම යති.

මේ නික්මයාම නව අත්දැකීමකි. අමතක නොකළ යුතු සමිඳුන්ගේ ක්‍රියාවකි. මතු පරපුරට උන්වහන්සේව හඳුන්වාදෙන කේන්ද්‍රීය අත්දැකීමයි. ඉඳහිට නොව සැමවිට සැමතැන සිහිතබාගත යුතු අපේ දෙවිඳුන්ගේ ප්‍රේමාන්විත වික්‍රමයයි.

නික්මයාම තුළ සිදුවන රතු මුහුද තරණය කිරීම කතාන්තරයක් ලෙස දිගහරින රටාව තුළින් ඉදිරිපත් කරන කරුණු කෙරෙහි අපගේ අවධානය දෙමු (නික්ම 14:1-14).

1. ඊශ්‍රායෙල් ජනතාව වහල් සේවයෙන් නිදහස් කිරීමෙන් තමා කළේ අනුවණ ක්‍රියාවක් යැයි පාරාවෝ සිතයි (නික්ම 14:5). (තම වාසියට හා පැවැත්මට උරදුන් පීඩිතයන්).
2. තමාට යටත් නොවන්නන් (තම පීඩක මතයට යටත් නොවන්නන්) නැවත තම ග්‍රහණයට ගැනීමට හෝ නොහැකි නම් හෝ විනාශ කරදැමීමට තම සේනාව සමඟ ලුහුබැඳ යාම.
3. ජයාන්විතව තම රටින් පලා යන (තමගේ පාලනයෙන් මිදී යන) ජනතාව දැක කෝපයෙන් යුක්තව ක්‍රියා කිරීම.

ඉහත කාරණ පීඩක ව්‍යුහයක යථාර්ථයකි. තම බලය තහවුරු කරගැනීමට හා පවත්වාගැනීමට පාලක පන්ති තම යටත්වැසියන් භාවිත කරති. තම බලය ගිලිහීයාම ගැන බියවෙති. එහිදී කුමන්ත්‍රණකාරීව කටයුතු කරති. කෙසේ හෝ (ඍජුව හෝ වක්‍රව) ස්වකීය ස්වාධිපත්‍යය තහවුරු කරගැනීමේ පාපිෂ්ඨ පීඩාකාරී ව්‍යුහයන් සැලසුම් කරති. ස්වකේන්ද්‍රීය ව්‍යුහයන් පාපිෂ්ඨ නොවේ ද? මෙයින් නික්ම යා යුතු නොවේ ද? එසේ නම් ඒ කෙසේ ද? නික්මයාම සන්දර්භයේ අන්තර්ගත දැක්ම සොයාගත යුතු නොවේ ද? මෙවැනි

පසුබිමක් තුළ ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රතිචාරය හා අභ්‍යන්තර තත්ත්වය කුමක් ද?

1. තමන් පසුපස ලුහුබඳින පාරාවෝගේ සේනාව දැක ඊශ්‍රායෙල් ජනයා බියවෙති, කැලඹෙති, දෙවිඳුන්ට මොර ගසති.


2. පෙර පරිදිම දෙවිඳුන්ට දොස් පවරති (නික්ම:5, 21; 6,9). උත්පත්ති 3 පරිච්ඡේදයේ මිනිසා පාපයට වැටීම පිළිබඳ දෙවිඳුන් විමසන විටදී ද දෝෂය බැර කරන්නේ දෙවිඳුන්ට ය. එහෙත් මිනිසාගේ පාපය අතට අසු වූ විට මිනිසා අන් අයට දොස් පවරා මරණ තීන්දුවට තල්ලු කරන විටදී මිනිසාට වරද නොතබා මරණ මිටියාවතෙන් මුදාගන්නේ දෙවිඳුන්ය (ජොහාන් 8: 10-11).

3. කලබලය, බිය නිසාම වහල්භාවයේ ව්‍යාජ රසමුසුතැන් හා ව්‍යාජ සුරක්ෂිතභාවය පිළිබඳ වර්ණනා කරති.

4. කැලඹිල්ලට පත් ජනතාවගේ අඳෝනා මෝසෙස් වටහාගෙන ප්‍රතිචාර දෙයි.

5. මෝසෙස් ජනතාව ව ධෛර්යවත් කරයි. එය පහත ආකාර වේ.
   "බිය නොවන්න"
   "ස්ථිරව සිටින්න"
   "අද නුඹලා ගලවන පිණිස දෙවිඳුන් ඉටුකරන දේ දකින්නහුය"
   "උන්වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක, නුඹලා නිශ්චලව සිටිය යුතුය" (නික්මයාම 14).

ඉහත විස්තරය වචනාර්ථ වටහා ගන්නට තැත් කළොත් දෙවිඳුන්ට ඉඩ දී උදාසීනව සිටින පුද්ගලයන් ලෙස ඊශ්‍රායෙල් ජනයාව වැරදි ලෙසට දැකිය හැකිය. මන්දයත් අප බයිබලයට පෞද්ගලික අර්ථය ඇතුළත් කිරීම නොව බයිබලීය අර්ථයට අප ලඟා විය යුතු කාරණයක් ඇති හෙයිනි. එබැවින් නිසියාකාරව බයිබලය අධ්‍යයනය කිරීම හා වටහා ගැනීම ඉතා වැදගත් වේ. මීට ඉහත සන්දර්භය සැලකීමේදී අපට පෙනී ගියේ අර්බුදකාරී අවස්ථාවකට මැදි වූ මිනිසාගේ ප්‍රතිචාරයයි.



මිනිසා අසරණ වූ විට දෙවිඳුන්ට මොර ගැසීම වහල් සේවයේ කයෝරභාවයට ඉඟියකි (නික්ම:2,23). ජනයාගේ දුඃඛිත තත්ත්වය දෙවිඳාණෝ දකින සේක. එබැවින් ඔවුන් මුදවා ගැනීමට පළමු පියවර සැලසුම් කරන්නේ දෙවිඳුන්ය.

එනම් සැබෑ විමුක්තියේ ප්‍රථම හා ද්‍රිතික සැලසුම්කරු දෙවිඳුන්මය. පීඩිත ව්‍යුහයකට යටත්ව සිටීම නිසාම තමාටම යැයි ගැලවීමක් උදාකර නොහැකි මිනිසාට ගැලවීමේ හෙවත් පීඩිතබවින් නික්මයාමේ මාර්ගය පෙන්වා දෙන්නේ දෙවිඳුන්ය. ඒ දෙවිඳුන්ට මොරගැසීම මිනිසාගේ විශ්වාසයේ පියවරකි. ගැලවීම දෙවිඳුන් සතුය. එයට ලඟා වීම අප නිදහස හා බැඳී පවතින්නකි.

නික්මයාම 14:10-12 හී සඳහන කුමන යථාර්ථයක් ඉඟි කරයි ද? ඔවුන් නැවතත් වහල් භාවයට කැමැත්තක් දක්වයි ද? තම පීඩාව දුටු, තම මොරගැසීමට සංවේදී, තමා වෙනුවෙන් පෙනී සිටින දෙවිඳුන්ව අමතක ද? නැත. දෙවිඳුන්ගේ දයා කරුණාවේ හා අත්‍යුත්කෘෂ්ටභාවයෙන් යුත් ගැලවීමේ ක්‍රියාවලියේ උත්තරීතර බව සනාථ කිරීමට පරිසරය සැකසීම බයිබලීය ලක්‍ෂණයකි.

එලෙසම අර්බුදකාරී හා අභියෝගාත්මක ජීවිත තත්ත්වය තවත් ගැඹුරකට ආරාධනා ලබන විශ්වාසයේ ප්‍රවේශයකි. මන්දයත් ප්‍රශ්නවලින් ගහන අර්බුදය තුළ විශ්වාසයේ ස්ථිරව සිටින්නාට තව තවත් විශ්වාසයේ ගැඹුරු අත්දැකීමක් භුක්ති විඳින්නට පරිසරය සකසන්නේය. එවිට ඔහු සමිඳුන්ගේ උපකාරයේ පන්නරය ලබන්නේය. සදා ස්ථිර සමිඳුන්ගේ රැකවරණය හා මැදහත්බව අත්විඳින්නේය. විශ්වාස කිරීම හා විශ්වාසයට සෙමිතික (හේබ්‍රෙව්) යෙදුම වන්නේ "එමුනාහ් හා එමෙත් (Emunah, Emeth)" ය. ඒ වචනවල අරුත වන්නේ පිළිවෙලින් "වඩාත්ම ස්ථිරව පවතින (නොසෙල්වෙන) යමකට ඇලවී එයම ආධාර කරගෙන සිටීම හා තම ආධාරකයේ උපකාරය පිළිබඳ ඇතිකරගන්නා වූ දැඩි ස්ථාවරයයි." ඊශ්‍රායෙල් ජනතාව දෙවිඳුන් කෙරෙහි අත්දුටුවේ උසස් ම සුරක්ෂිතභාවයි. ඊශ්‍රායෙල් ජනතාව ලද නික්මයාම වනාහි පීඩිත බවෙන් විමුක්තිය, නිදහස කරා පියමං කිරීමකි.

කිතුනුවන් ලෙස අපට ඇත්තේ නිරන්තර නික්මයාමකට ආරාධනයකි. ගැලවීම ලබා අවසාන ද? නැතහොත් ගැලවීම ලබමින් ගමන් කරමු ද? ගැලවීම ලබා අවසාන වූ පසු සේවය කරමු ද? එසේත් නැතිනම් ගැලවීම ලබමින් සේවයේ යෙදෙමු ද? මෙයට පිළිතුර ක්‍රිස්තු පාස්කුවේ දී අනාවරණය වනු ඇත.

**පී.ඩී. රොහාන් අප්පුහාමි.**

# භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

## 2020 මැයි මාසය – "වාක් ප්‍රසාද ගැබයෙනි"

## 2020 ජුනි මාසය – "ශුද්ධ වූ පවුලක් වෙමු අපි"

හිතවත් ලේඛක / පාඨක හැම වෙත,
"භක්ති ප්‍රබෝධනය" සඟරාවේ ගුණාත්මකභාවය වැඩි කිරීමට අර්ථාන්විත, භාෂාව නිවැරදිව හසුරුවමින්, අදාළ තේමාවට ලියන ලිපි හැකි ඉක්මනින් අප වෙත එවන්න. "භක්ති ප්‍රබෝධනය" උන්නතිය සඳහා ඔබ කරන යෝජනා / විවේචන අපට අස්වැසිල්ලකි. භක්ති ප්‍රබෝධනයේ පාඨකයෝ වන්නට ඔබ දන්නා අයට ආරාධනා කිරීම ඔබද අපගේ දූත මෙහෙවරට දායක වීමකි.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය" අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**
නව විද්‍යුත් තැපැල (ඊ-මේල්) : bhakthi.prabodhanaya@gmail.com

# ස්කූටරයෙන් එතෙර වීම

අද ශ්‍රී ලංකාවේ පාරම්පරික කර්මාන්තවලටත්, ඒ හා බැඳුණු පරිසරයත් නවීන ලෝකයේ ක්ෂණික මෙවලම් අතික්‍රමණය කරනු ලැබ ඇත. ඉහළ නිෂ්පාදනයක් හා අඩු කාලයක් ද හා අඩු ශ්‍රමය මූලික කරගෙන ලාංකේය නිෂ්පාදන ආර්ථිකය ඉතා ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. මේ කිසිවක් නොදන්නා පරිදි, වසර 70 ඉක්ම වූ නිදහසින් පසු ශ්‍රී ලාංකික දේශපාලන යන්ත්‍රණය ඉතා වේගවත් පසුපස ගමනක් යාම අපට නිරීක්ෂණය වේ.

යටත් විජිත සමයේ තැනූ මහා මාර්ග හා දුම්රිය මාර්ග ඔස්සේ සුද්දාට බැණ තර්ජනය කරන දේශීය උදාසීන කතාබහ අප සවන් පුරා දිනපතා කණ වැකුණත් අලුත් වැඩපිළිවෙලක සමාරම්භයක් නොපෙනේ. බුද්ධිගලනය ඉතා ඉහළ රටක් වූ අප දේශයේ මහා මාර්ග පිරී ඇත්තේ අසල්වැසි රටවල වාහන වලිනි. අවුරුදු 15 ත්, 60 ත් අතර අප රටේ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි පිරිසෙන් වැඩි දෙනා වැඩ කරන වෙලාවෙන් 20% ක් පමණ මැද පෙරදිග ඉන්ධන පුලුස්සමින් මාර්ගය මත, ඉතා අඩු තාක්ෂණික මෙවලම් / වාහන මත රැඳී සිටිති. ඉතා ඉහළ තරගයත්, තරුණ මදයත් නිසා හමුවන ඉතා කුඩා ඉඩකඩක දමා තව ජීවිත පරදුවට තබා මාර්ගයේ අප ගමන් ගන්නා තරුණ පරපුර ඉතාමත් කෙටි කලකින් අනතුරුවලට බඳුන් වේ.

පුංචි පවුල රත්තරන් ලෙස 80 දශකයේ ඇති වූ තත්ත්වය සමඟ ලංකාවේ සෑම පස් දෙනකුගෙන් කෙනෙක් අද වසර 60 ට වැඩිය. තරුණ දූපුතුන් මෙසේ අකල් අනතුරුවලට පත් වූ විට මුළු පවුල හා යැපෙන්නෝ බලවත් ලෙස අසරණ වෙති.

අප රෝහල් පද්ධතිය වෙත ඉතා තරුණ කොටස් හදිසි අනතුරුවලට  බඳුන්ව පැමිණීම ඉතා ඉහළ අගයක් ගන්නේ මන්ද?

සමාජයේ සංකීර්ණ අවශ්‍යතා සඳහා පහ වසර කඩයිම් විභාගයේ සිට උපාධි පරීක්ෂණ දක්වාත්, ඉන් එපිට ආර්ථික ඉලක්ක වෙතත්, අති ධාවනකාරීව දිවීම ලාංකික සමාජය වෙළාගෙන ඇත. මුදල හා බලය හඹායන්නන් ඉහළයාම සමාජය අතිශය තීරණාත්මක තරගාවලියකට හේතුවී ඇත. මේ හැම ඉලක්කයක්ම තම කුඩා හිසේ දරා ඉතා අඩු තාක්ෂණික මෝටර් බයිසිකලය හෝ අටපට්ටමකට කොළ ඇලවූ සේ වූ ත්‍රීවීලරයේ නැගී යන ශ්‍රී ලාංකිකයා ඉතා ඉක්මණින් මහමඟ කෝපවන අතර මහමඟදී ඉහළ අගයකින් අනතුරු සිදුකර ගනියි.

තම මනස නිරවුල් නොමැතිකමත්, ඉතා වෙහෙස වී ක්‍රියාකිරීම නිසා වන නින්දයාමත් නිසා මහමඟ අනතුරු ඉතා ඉහළ ගොසින් ඇත. දිනකට මාරක අනතුරු 5-6 ක් වාර්තා වන අතර, මේ නිසා ජනවාර්ගික අර්බුදය නිසා මිය ගිය ගණනට වඩා කීප ගුණයක් දැන් මහමඟ නිරපරාදේ දිවි පුදා ඇත.

එසේ නොමැරෙන අයගේ කොටසකට සදාකල් යහනක් මත සිටීමටද, අත්වාරුවෙන් හෝ රෝදපුටුවෙන් යාමටද සිදුවීම දැයේ අවාසනාවකි.

ඉරිදා දහම් පාසැල් නොගොසින් ටියුෂන් කඩයට යාමට පුරුදු වූ තරුණ පරපුර තම විකල් වූ සිහියෙන් මහමඟ අනතුරු කරගෙන, රටේ ජාතියේ උන්නතියට ඇති මුදල්ද විනාශ කරති.

11 වන පිටුවට.....



# සොඳුරු වසන්තයේ අභියෝග

කඳු ශිඛර අතරින් කෙමෙන් කෙමෙන් නැග එන හිරු දෙස මෙන්ම හිමිදිරි උදැසන කෙමෙන් කෙමෙන් විකසිත වන මලක් දිහා බලා සිටින්නට ඔබත් මමත් ආශා කරන්නේ දෙවියන් වහන්සේගේ මැවිල්ලේ ආශ්චර්යය අගය කරමින් නොවේද? කුරුල්ලන් කැදලිවලින් ඉවතට විත් දවසේ වැඩ ආරම්භ කරන්නේ ඉතාමත් ම සතුටින්, ඒ සියල්ල අපට කියන්නේ අපව මවා අපව රකින ජීවමාන දෙවියන්ගේ ක්‍රියාකාරි වැඩ හිඳිම අත්දකින්නටයි. බලන්න අර ලස්සණ මල් පොහොට්ටුවක් කෙමෙන් කෙමෙන් විකසිත වන සැටි, මද්දහනට පෙර මඳ අවු රස්මියෙන් දිදුලන මල කොතරම් ලස්සණද?

මල! ඔබ එක් දිනයක පොහොට්ටුවක් ලෙස සුරක්ෂිතව සිටියා මට මතකයි. එහෙත් දැන් ඔබ විකසිත වු සුන්දර මලක්, ඔබේ වර්ණ, සිනිඳු පෙති, හැඩය අභිමානයෙන් කියා පාන්නේ අපූරු කතා පුවතක්. මන්ද මාරුතයේ සැලෙන, ලෙලෙන කුසුමක් එයට ඔරොත්තු දෙමින් තව තවත් චමත්කාර ජනක ලෙස ලෝකයා ප්‍රීණනයට (පිනවීමට) පත් කරන්නේ යම් සේද පවතින අභියෝග වලට නොසැලි දරා ගැනීමේ ශක්තිය තුළින් කියා පාන පණිවුඩය නම් සුළගේ රිද්මය කෙසේ වුවත් ස්ථාවරත්වයේ ප්‍රබල බව අපට කියා පැවේ අභියෝගයක් ලෙසිනි. කුසුම තමා හට ගත් ශාකයෙන් හෝ නටුවෙන් හෝ ගිලිහී නොයමින් ස්ථාවරව රැඳී සිටින්නට වෙර දරනා බැවිනි.

මද්දහනට පෙර මඳ අව් රස්මියෙන් දිදුලන මල කියාපාන්නේ ඔබගේ තාරුණ්‍යයේ (තුරුණු වියේ) චමත්කාරයයි. ඔබත් හරියටම ඒ වගේ නොවේද? සුළගේ රිද්මයට මලක් ඒ මේ අත ලෙලදෙනවා. සමාජයේ නොයෙකුත් අභියෝග, දුෂ්කරතා මධ්‍යයේ ඔබත් ඒ මේ අත සැලෙන අවස්ථා එමටයි. තරුණ ඔබ ජීවිතය එකම රිද්මයකට යන්නේ නැ. එකම රිද්මයකට ජීවිතය රඳවා තබා ගන්නත් ඔබට නොහැකි වෙනවා. හදිසියේ පැන නඟින ප්‍රශ්න ගැටලු සහ දුෂ්කරතා ජීවිත රිද්මය සහමුලින්ම වෙනස් කරනවා. තරුණ ඔබේ සිහින, සිතුම් පැතුම් ඇති වෙනවා නැති



වෙනවා. ඒ වැනි අවස්ථා වලදී දේව වචනය මෙහෙම කියනවා ***"පොදුවේ හැම මිනිසකුටම මූණ පාන්නට ඇති පරීක්ෂා හැර අනිකක් ඔබ වෙත පැමිණ නැත. ඔබට දරා ගත නොහැකි පරීක්ෂා ඔබ පිට පැමිණීමට ඉඩ නොහැර ඔබට පරීක්ෂා දැරිය හැකි වන සේ ඒ සමග ම ගැලවීමේ මග ඔබට සලසා දෙන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකිය"*** **(1 කොරෙන්ති 10:13).** නටුවෙන් ශාකයට සම්බන්ධව, නටුවෙන් ගිලිහී නොගිය මලක් මෙන් තාරුණ්‍යයේ ඔබේ ජීවිතය ස්ථාවරව රැඳී සිටිය යුත්තේ දෙවියන් වහන්සේගේ කැමැත්ත මතය. දෙවියන් වහන්සේගේ යහපත් කැමැත්තට අවනත වී එය ඉෂ්ට කරවීමට උන්වහන්සේ ම ඔබ තුළ ක්‍රියා කරන සේක.

තරුණ විය අවදිව සිටිය යුතු, අවදිව සිටින සමයක් නිසා මෙම අවදිව සිටීමෙන් තම ජීවිත අභියෝග ජය ගන්න, 1 කොරෙන්ති 10 වන පාඨය හුවා දක්වයි. තවද එය ඔබට පන්නරයක් ආලෝකයක් වගේම ශක්තිමත් අධ්‍යාත්මයක් දෙනවා නියතයි. මා එයට තවත් යමක් එක් කරන්නම්..... ස්වශක්තිය, ස්වරූදියාව හා ස්වාභිමානය යන ගුණාංග තරුණ ජීවිතයේ වර්ධනය කර ගැනීම තුළින්, ඔබේ ජීවිතයේ සාර්ථකත්වයක් කරා යා හැකි වෙනවා. ඒ විතරක් මදි, තරුණ ඔබ දෙපයින් නැගී සිටින්නට නම් දනුම, ආත්ම ගරුත්වය, එඩිතරකමත් අවශ්‍යයි. ජීවිතය සමබරව පවත්වා ගෙන යාමට මේ හැම කරුණක් ගැනම ඔබගේ අවධානය යොමු කළ යුතුය. **මේ බලන්න ස්වාභිමානයෙන් යුතුව කටයුතු කරන තරුණයා තමන්ගේ විශ්වාසය මත නැගී සිටිමින් කටයුතු කිරීමට කැමැත්තක් දක්වනවා.** එසේ නම් තරුණ ඔබ යමක් කළ යුතුව තිබෙනවා, ඒ සඳහා තරුණ ඔබේ හැකියා දෙවියන් වහන්සේ ඔබට තිළිණ කොට දී ඇති තලෙන්තු හොඳින් හඳුනා ගනිමින් ඒවා වර්ධනය කර ගන්නට උත්සාහ කළ යුතුය. තම තරුණ ජීවිතය කිසිම අයුරකින්වත්, තව කෙනකුටවත්, දෙයකටවත්, අවස්ථාවකටවත් පාලනය කිරීමට ඉඩ නොහැරිය යුතුය. ඔබ එසේ ස්වපාලනයක් ඇති තරුණයකු වූ විට ඔබ ස්වාධීන, ප්‍රීතිමත්, තෘප්තිමත් පුද්ගලයකු ලෙස ගොඩ නැගෙන්නේ අර මල් කැකුළ වගේ නොවේද? එසේ නම් තරුණ ඔබ, ඔබ ගැනම ක්‍රියාකාරී ලෙස (සක්‍රීය) උනන්දුවක් ඇති කර ගන්නට අවශ්‍යයි. හැම විට ඔබේ ජීවිතය ගැන තීරණ ගැනීම ඔබම කරන්න.

තරුණයකු ලෙස සාර්ථකත්වයක් කරා යන ගමනේ තිබිය යුතු ගුණාංග ගැන අප කථා කළා. හරි ඒ සාර්ථකත්වය වඩාත් සඵල කර ගන්නට නම් අපට වැදගත් වන්නේ යහපත් චරිතයක් තිබීමයි. එසේ නම් යහපත් යැයි කියන චරිතයක තිබිය යුතු ගුණාංග දෙස අපි ටිකක් විපරම් කර බලමු. අවංකභාවය, විශ්වාසවන්තභාවය, ස්වයං විනය, ඉගෙනීමට සූදානම, වගකීම් බාර ගැනීම, අප්‍රතිහත ධෛර්යය, සංවේදී භාවය සහ සදාචාරාත්මක භාවයයි. එසේ නම් යහපත් චරිතයක් ඇති තරුණයකු හඳුනා ගන්නට අපට පහසුයි. මේ සැම ගුණාංගයක්ම ඔහු / ඇය පවසන වදන ඔහුගේ / ඇයගේ ක්‍රියා සමග සමගාමී විය යුතුයි. කියන දේ කරන, කරන දේ කියන විනිවිද දැක්මක් ඇතිව ක්‍රියා කිරීමට හැකිවීම ද වැදගත් වෙනවා. එවැනි තරුණයෙක් කීර්තිමත් තරුණයෙක්. තවද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාදර්ශය අන් සැමට ම වඩා අගනේය. එසේ නම් තරුණ ඔබේ ආදර්ශය, අභියෝගය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේයි. උන්වහන්සේ තම ජීවිතය මගින් මිනිස් ජීවිතයේ ඇති වටිනාකම ප්‍රේමාන්විතව පෙන්වා දෙමින්, තම ජීවිතයෙන් මිනිස් ජීවිත උත්තරීතරත්වය කරා ඔසවා ලන්නට තම මුළු ජීවිතය ම පූජා කළ සේක. තරුණ ඔබේ ජීවිතය ජයග්‍රහණය කරා සාර්ථකව ගෙන යන්නට නම් ජීවිතය හරියාකාරව පාලනය කරගත යුතුය. හංසයා දියෙන් කිරි වෙන් කර ගන්නේ යම් සේද ඔබද ප්‍රඥාවෙන් කළ යුතු දේ තෝරා බේරා ගැනීමට තරම් සූක්ෂම බුද්ධියකින් මුවහත් විය යුතුය. ඔබගේ හැම මොහොතකම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ සමග සිටිමින් ඔබව මෙහෙයවන බව විශ්වාස කරමු.

**ගරු ඇන්ජලා ප්‍රනාන්දු,**
දයාවේ පැවිදි සොහොයුරිය,
දයාවේ පැවිදි ආරාමය, කෑගල්ල.

# පසම් ඉතිහාසයෙන් බිඳක්

"සඳ පහනේ පිපි වැටකෙයා මල සේ සුවඳ දීදී තිබිලා
සඳ පහනේ පිපි මානෙල් මල සේ රුවට රුවේ තිබිලා
සඳ පහනේ කිරි මුහුද වගේ අහෝ සුදට සුදේ තිබිලා
ජේසු අනේ මේ කිමද වුණේ ඔබෙ මුහුණ ලෙයින් වැසිලා"



කිතු බැති ගී ගණයක් හැඳින්වීම සඳහා ශ්‍රී ලංකාවේ ඇතැම් පලාත් වල භාවිත වන "පසම්" හෝ "පසන්" හෝ "පසං" යන ශබ්දය ජාත්‍යන්තර විශ්වකෝෂ වල දක්නට ලැබෙන්නේ නැත. එහෙත් ඒ ශබ්දයට සමාන අර්ථ ඇති පද පෘතුගීසි, ලතින්, ඉංග්‍රීසි ආදි භාෂාවල දක්නට ලැබේ.

මෙම පසම් යන ශබ්දය සම්බන්ධව හා එහි අර්ථය පිලිබඳව සිතා බැලීමේදී එම ශබ්දය සඳහා ලබා දී ඇති විවිධ වූ අර්ථකතනයන් පිලිබඳව අවධානයක් යොමු කිරීම ඉතා සුදුසු යැයි මට සිතේ.

1. අති උතුම් එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි. රදගුරුතුමන්ට අනුව පසම් යනු දුක්ප්‍රාප්තිය යන අරුත් ඇති "Paixao" යන ප්‍රතිකාල් පදයෙන් බින්න වූවකි.

2. ගරු මර්සලින් ජයකොඩි නි.ම.නි. පියනමට අනුව එය "Passiote Christ" යන ලතින් බසින් බින්න වූවකි.

3. තවත් සමහර දෙනාගේ අදහස අනුව එය දුක්ප්‍රාප්තිය යන අරුත් ඇති "Passion" යන ඉංග්‍රීසි පදයෙන් බින්න වූවකි.

එහෙත් බහුතරය විසින් පිළිගනු ලැබ ඇත්තේ පීරිස් රදගුරුතුමන්ගේ මතයයි. එනමුත් දෙවැනි හා තෙවැනි මත ද ඉඳුරා බැහැර කළ නොහැක්කේ ඒ තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය යන අර්ථය පළ වන බැවිණි. පසම් ගීතය හා දුක්ප්‍රාප්තිය ඇත්තේ අත්‍යන්ත බැඳීමකි.

"ලතෝනි" යන පදය "පසම්" යන පදය සමඟ නිතර භාවිත වනු වූකලි අසන්නට පුළුවන. ඒ වූකලි පසම් යන පදය සිංහල කරගන්නට දැරූ වෑයමක්දැයි බැලූ බැල්මට පෙනී යන නමුදු "ලතෝනි" සහ "පසම්" යනු රචනා දෙවර්ගයක් බව වැඩිදුරටත් කරුණු විමසා බලන කල පෙනේ. පොදුවේ "පසම්" යන පදය දුක්ප්‍රාප්ති ගායනා හැඳින්වීම සඳහා යොදාගෙන ඇති අතර දේව මෑණියන් විසින් ගායනා කරනු ලබන වැලපුම් ගී සඳහා "ලතෝනි" යන විශේෂ පදය යොදාගත් බව පැහැදිලි ය.

පසම් ගීත ගැන දන්නෝ ඉතා විරලය. බොහෝ විට කිතු බැතිමතුන් සුළුතරයක් පමණි. ඔවුනතුරින්ද කතෝලික කොටසක් පමණි. කතෝලික කොටස් අතරින් ද බොහෝ විට මුහුදුබඩ පළාත් වාසී කතෝලික ජනයා පමණි. පසම් යනු සියවස් ගණනක් තිස්සේ ඒ කතෝලික සුළුතරය විසින් ගායනා කරනු ලබන ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය අලලා විරචිත සිංහල ගීත විශේෂයකි.

මෙම ගී බොහෝ විට අති විලම්බ ලයෙන් ගැයෙයි. තාල රහිතය. සංගීත භාණ්ඩ භාවිතා නොකෙරේ. "දූවේ පසම් ගායනා", "පසම් හා ලතෝනි" ආදි නම්වලින් කැසට් පට කිහිපයක් නිකුත් වී තිබේ. එම කැසට්පටවල එන පසම්

ගායනා කලාත්මකය සංගීතය සහිතය. ඒ වූකලී පසම් ගීයෙහි ප්‍රාකෘතික ස්වරූපය වෙනස් කිරීමකැයි හැඟේ.

පසම් හා ලතෝනි පිළිබඳ වැඩිපුර අධ්‍යයනය කිරීමේදී ජාකෝමේ ගොන්සාල්වෙස් පියනම අමතක කළ නොහැකිය. මන්දයත් පසන් යන නාමය තැබීම උන්වහන්සේ විසින් කරන්නට ඇතැයි සිතිය හැකි සාක්ෂි හමුවීම ඊට කදිම නිදසුනකි. ස්වකීය දුක් ගායනා සංග්‍රහයට උන්වහන්සේ නම් තබන්නේ දේශනා නවයේ පසන් පොත යනුවෙණි. "පසන්" යන පදයේ ප්‍රථම භාවිතය එය බව මේ පිළිබඳ කරුණු සෙවීමේදී අවබෝධ කරගත හැකිය.

එමෙන්ම ජාකෝමේ ගොන්සාල්වෙස් ඔරතෝරියානු පියතුමාගේ සංගීත ඥානය උපයෝගී කර ගනිමින් සහ ශ්‍රී ලාංකික ජන ගී සම්ප්‍රදාය, නාඩගම් ගී සම්ප්‍රදාය උපයෝගී කර ගනිමින් රචනා කර ඇති මේ ගීත තුළ ඇති සුවිශේෂත්වය වනුයේ බැතිමතුන් තුළ උග්‍ර වේදනාවක් අවුළුවා එමගින් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අප්‍රමාණ භක්තියක් උත්පාදනය කිරීමට හැකි වීමයි.

එහෙත් අවාසනාවකට මෙන් මෙම පසම් ගායනය වර්තමානය වන විට ශීඝ්‍ර ලෙස තුරන් වී යන බව අපට සක්සුදක් සේ පැහැදිලි ය. මේ පිළිබඳ කතිකාවක් ගොඩ නැගීමට හා අප මතු පරම්පරාවට මේ ගායනා ශෛලිය පිළිබඳ අවබෝධයක් දීමට සුදුසු කාලය පැමිණ ඇතැයි මම විශ්වාස කරමි.

"අයි අයියෝ අප උදෙසා, දේව පුත්‍රයා විඳි දුක්සා...."

**මූලාශ්‍ර :**

මහාචාර්ය සුනිල් ආරියරත්න - කැරොල් පසන් කන්තාරු.

මහාචාර්ය සුනිල් ආරියරත්න - ජාකෝමේ ගොන්සාල්වෙස් තෝරාගත් කෘති

**ගරු අලංක බණ්ඩාර**
**නි. ම. නි. සහෝදරතුමා**

7 වන පිටුවෙන්.....

සෞඛ්‍ය සේවය හා මහජන බදු මුදල් මෙසේ අනතුරු වූ තරුණ රෝගීන් වෙනුවෙන් වෙන් කිරීමෙන්, අනිකුත් අංශ වෙත යොමු කිරීමට ඇති මුදල් අහිමි වේ. සරල ශල්‍යකර්මයකට පවා ශ්‍රී ලංකා රුපියල් ලක්ෂයකට වඩා රජය වියදම් කරයි. මේ මුදල් පුරවැසි අප කවුරු හෝ ගෙවිය යුතු වේ.

මේසා විනාශයක් නවතා ගන්නට, ආධ්‍යාත්මික දියුණුව තුළින් තම සිහිය පිහිටුවාගත් පරපුරක අවශ්‍යතාව එළඹ ඇත. දේශපාලනිකව ද එදා චීන විප්ලවයෙන් පසු නිෂ්පාදන ආර්ථිකයේ යටිතල පහසුකම් දියුණු විය. එහි ප්‍රතිඵල අද චීනය පෙන්වමින් ඇත. එහෙත් අප පාලකයෝ තවමත් මාර්ග පද්ධතිය දියුණුකර ප්‍රමිතිගත වාහන පමණක් ගෙන්වීමට අපොහොසත් වෙති.

පවුලේ හා පාසැලේ විනය පිරිහීම මහමග විනයට ඉතා තදින් බලපාන අතර ඉක්මනින් කෝප වීම නිසා ද, මත්ද්‍රව්‍ය හා මත් වතුර නිසා ද අනතුරු ඉහළ යාමට ඉතාමත් බුද්ධිමත් තීන්දු හා ක්‍රමික ශිෂ්ටාචාරය වෙනස් වීමත් අවශ්‍ය වේ.

හැම ගමනකට පෙර තම සිහිය ඒකාග්‍ර කොට සමිඳු අබියස යාච්ඤාවෙන් අරඹා ඉතාමත් ඉවසීමෙන් මහමග ගමන් ගොස් එක් අනතුරක් අපි අඩු කරමු. එතෙරවීමට යහපත් සමාධිගත සිතක් පිහිටුවා අරමුණු පැහැදිලිකොට ඉදිරිය ඉතා පැහැදිලිව බලා ගමන්කර මෙලොවත් සගලොවත් තරණය කරමු.

**වෛද්‍ය සචිත මෙන්ඩිස්,**
**වෛද්‍ය නිලධාරී, ප්ලාස්ටික් ශල්‍ය ඒකකය,**
**උතුරු කොළඹ - රාගම.**

# තීරණාත්මක මංසන්ධියක අපි

අපි තීරණාත්මක මංසන්ධියකට පැමිණ සිටින්නෙමු. රටක් ලෙස සතුටු වන්නට හැකි තැනක නොසිටීම ගැන ඇතිවන්නේ කණගාටුවකි. ආර්ථික වශයෙන් පමණක් නොව දේශපාලන, සමාජීය, සංස්කෘතික සහ ආධ්‍යාත්මික වශයෙන් සතුටු වන්නට අපට ඇත්තේ අතීතය පමණි. මේ පරිහානිය ගැන එකිනෙකාට ඇඟිල්ල දිගු කිරීමෙන් කිසිඳු සුගතියක් ඇති නොවනු ඇත. එසේනම් අද අප කළ යුත්තේ කුමක් ද?

වසර 2500 කට ආසන්න අතිශයින්ම ගම්භීර වූ බෞද්ධ දාර්ශනික ඉතිහාසයක් තුළ වැඩුණු රටකට වෙනත් ආගමික ඉගැන්වීම් වලින් සහ භාවිතවලින් ලැබූ පෝෂණය කියා නිමකළ නොහැකි තරම් ය. ක්‍රිස්තියානි, ඉස්ලාම් සහ හින්දු ආගම් මේ දෙරණ තුළ පැල වූයේ කුමන ආකාරයකටදැයි විමසනවාට වඩා ඒවායින් අප ලැබූ පෝෂණය අවබෝධ කරගැනීම වැදගත් වේ. එහෙත් මේ යථාර්ථය වටහා ගැනීමට අප අසමත් වී ඇත. බෞද්ධ දර්ශනය ආගමක් බවට පරිවර්තනය කර ගනිමින් ශාසනිකව එය රැකගැනීමට උත්සාහ කරන ඊනියා කණ්ඩායමක් ආයතනික ගත වූ අනිත් ආගම් නිසා මේ රටේ සැබෑ මුල් ඉදිරී යනවායි චෝදනා කරමින් සිටිති. එහි ප්‍රතිඵලය විවිධ ආගම් ඉගැන්වීම් සහ විශ්වාසයන් මත සිටින ජනතාව තුළ අවිශ්වාසය සහ සැකය ජනිත කිරීම මිස වෙන කුමක් ද?

භූගෝලීය වශයෙන් භූමියක් වෙන් වූ විට එය නැවත් එක් කිරීම එතරම් අපහසු වන්නේ නැත. මීට දශකයකට පෙර අප රට එසේ භූගෝලීයව වෙන්කරගෙන තිබුණි. මහා විනාශයක් සිදු වූවත් කෙටි කාලයකදී මිනිසුන් විසින් මෙහෙයවනු ලැබූ භෞතික යුද්ධයකින් ඒ භූගෝලීය බෙදා වෙන් කිරීම අවසන් කර රට නැවතත් එක ධජයක් යටතට පත් කර ගනු ලැබීය.

එහෙත් හදවතින් සහ සිතුවිලි වලින් බැඳී සිටින විවිධ ජාතීන් සහ එකිනෙකට වෙනස් ආගම් අදහන ජනයා තවමත් බේදී වෙන්වී සිටිති. මේ වෙන්වීම රටට දරාගත නොහැකි ය. මක්නිසාදත් අප අද සියල්ලෝම ජීවත් වන්නේ එකිනෙකා කෙරෙහි බියෙන්, සැකයෙන් සහ අවිනිශ්චිත බවකින් යුතුව ය. මේ මොහොත, විශේෂයෙන්ම අනාගතය බාරගැනීමට සිටින වර්තමාන තරුණ තරුණියන්ට තීරණාත්මක වන්නේ ඒ නිසා ය. රටක තරුණ ප්‍රජාව ලෙස අප නියත වශයෙන්ම එතෙරවීමක නිරත වියයුතු මොහොත උදා වී ඇත.

ශුද්ධ වූ බයිබලයේ සඳහන් වන පරිදි නික්මයාමේ අවසාන භාගයේදී දෙවියන් කෙරෙහි තම විශ්වාසය පලුදු වී නොගියත් මෝසෙස් සිටියේ දැඩි වෙහෙසකට පත් වූ මනසකින් යුතුව ය.

පාරාවෝ යටතේ වහල් බවින් ජීවත් වීම මේ නිදහස සොයා යන ගමනට වඩා අපහසු බව තම ජනතාව මැසිවිලි කියන විට මෝසෙස් දෙගිඩියාවට පත් විය.

වත්මන් ප්‍රජාතන්ත්‍රවාදී අරගලයට ඇති බාධාව ද මෙයමය. එහි පල දරන්නට කාලයක් ගතවන අතර ඒ සඳහා ජනතාව කැපකිරීම් කළයුතු වන්නේ ය. එහෙත් අපි පවුලකට හෝ කණ්ඩායමකට යටත්ව ජීවත්වීමට කැමැත්තෙමු. මෙය සැබවින්ම නොදැනුවත්කම මෙන්ම විමුක්තිය වෙනුවෙන් කැපවීමට ඇති මැලිබව නිසා සිදු වේ.

මෝසෙස් අත්හැරියේ නැත. පාරාවෝගේ රජ මාලිගයේ සියලු සැප සම්පත් ඇතිව ජීවත්වීමට හැම අවස්ථාවක් තිබියදීම ඔහු සැබවින්ම අයත් වන්නේ පීඩාවට පත් කරනු ලැබූ ජනතාවට බව අවබෝධ කර ගත්තේ ය. තම සහෝදරයා පීඩාවට පත්කරන විට ඔහු වෙනුවෙන් ඉදිරියට එන්නේ ඒ නිසා ය. දෙවියන් වහන්සේ මේ තරුණ මෝසෙස්ගේ "අවබෝධ කරගැනීම" සහ "හිත හැරීම" හොඳින් දුටු සේක. පාරාවෝගේ වහල් බවින් පීඩනයට පත්වී සිටින තම ජනතාව ගලවා ගැනීමේ අරගලයේ නායකත්වය මෝසෙස් වෙත පවරන්නේ එබැවිනි.



දෙවියන් වහන්සේ විසින් තමන් වෙත පවරනු ලබන වගකීම මෝසෙස් ඉතා හොඳින් ඉටු කරමින් සිටින අතර අවසානයේ "පොරොන්දු දේශය" ඈතින් දිස්වෙන අවස්ථාවේ ඔහු තම ජනතාව ඒ වෙත කැඳවාගෙන යාමේ නායකත්වයේ වගකීම ජොසුවා වෙත පැවරුවේ ය. ඒ වනවිට ජොසුවා ද නායකත්වයේ වගකීම දැරීමට ප්‍රමාණවත් ලෙස සූදානම් වී සිටියේ ය. අද අපගේ තරුණ ජනතාව ද එවැනි තීරණාත්මක මොහොතකට පැමිණ ඇතැයි නැවත සඳහන් කිරීමට කැමැත්තෙමි.

දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර ශක්තිමත්ව ගොඩනැගී තිබූ එහෙත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දුන් නිදහස නිසි ලෙස වටහා නොගැනීම නිසා බිඳී ගිය සබඳතාව නැවත ගොඩනැගීමට දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයා මෙලොවට මාංසගත කළ සේක. සකල මනුෂ්‍ය ජනතාවට ශුභාරංචිය සහ විමුක්තිය උදාකර දීමට මෙලොව බිහිවන ජේසුස් වහන්සේ නියමිත කාලයේදී තම දූත මෙහෙවර ආරම්භ කළ සේක.

**“මක්නිසා ද දිළිඳුන් හට ශුභාරංචිය දේශනා කරනු වස්, උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද, අන්ධයන්ට පෙනීම ද ලැබෙන බවට දන්වන්නටත්, පීඩිත වූවන් මුදන්නටත් ස්වාමින් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක” (ශු. ලූක් 4: 18-19).**

මේ මහා දූත මෙහෙවර ගමනේ **විශේෂ සන්ධිස්ථානය වන්නේ ජේසුස් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය වූ අතර එය ජනතාවට තවත් දිගු ගමනක් යන්නට ආරම්භයක් විය.** දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර සම්බන්ධය එමත ගොඩනැගීම ශු. ලූක් තුමා ජේසුස් වහන්සේගේ කපාල කන්දේදී කුරුසගස මත උකුත්වීමත් සමගම ප්‍රධාන දේවමාලිගාවේ තිර දෙකට ඉරී යාම සටහන් කරමින් මනා ලෙස පැහැදිලි කර දෙයි.


ඒ මහා ජීවිත පරිත්‍යාගය සිදුවී අවසානය. අප එතෙර විය යුතු දිශාව සහ මාර්ගය ඒ තුළින් පැහැදිලි කර දී ඇත. මේ එතෙර වීමේ ප්‍රධාන වගකීම බාරගත යුතුව ඇත්තේ තරුණ තරුණියන් ය. ඒ සඳහා ඔබට මියයාමට අවශ්‍යවන්නේ නැත. මන්ද ඒ පරිත්‍යාගය දැනටමත් සිදුව ඇත.

අන්තිම රාත්‍රී භෝජනය පැවති අවස්ථාවේ දී ජේසුස් වහන්සේ **අපට එතෙර වීමට කළ යුතු දෙය ඉතාමත් හොඳින් පැහැදිලි කළ සේක. “ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරයයි, මා සිහිකිරීමට මෙය සිදුකරන්න”** (ශු. ලූක් 22: 19). අවාසනාවකට ජේසුස් වහන්සේගේ මේ වදන්වල සැබෑ අර්ථය අද වන විට අප හිස් වත්පිළිවෙතක් බවට පත්කරගෙන ඇත.

කතෝලික සභාව විසින් ආරම්භ කරනු ලැබූ දෙවන වතිකානු සමුළුවේදී මෙය හුදු දිව්‍ය පූජාවේ වත්පිළිවෙතින් ඔබ්බට දිවෙන සැබෑ ජීවිත අභ්‍යාසයක් බව තහවුරු කළත් එය සභාව තුළම ඇතැම් අය විටක බැහැර කරයි. එනිසා අද දිව්‍ය පූජාව හුදු සාංසික එකතුවීමක් පමණක් බවට පත්වන අවස්ථා ඇත. **ජේසුස් වහන්සේගේ එම වදන්: “මා කළාක් මෙන් ඔබත් එය කරන්න”. එය පහසු දෙයක් නොවූවත් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල සහ ජීවිතයේ සැබෑ විමුක්තිකාමී හරය වටහා ගන්නේ නම් එය අපහසු කාර්යයක් වන්නේද නැත.** ඒ එතෙරවීම අප කළ යුතුම වන්නේය. මේ තීරණාත්මක මොහොතේ කිතුනු තරුණ තරුණියන්ගේ එකම යොමුව සහ තෝරාගැනීම එයම වේ.

**අරුණ ශාන්ත නෝනිස්,**
**තලාහේන, මීගමුව.**

# ලොකු හොරකම




සීතට ගුලි වී පැදුරේ
නින්ද නොනින්දත් අතරේ
පොරවාගෙන ඉද්දි සරම
ඔලුවට ඒයි මෙන්න මෙහෙම
මුල් සභාව ක්‍රිස්තියානි
ඒවකට ඒ නම නොතිබිණි
කපාල කන්දේ ඇරැඹිණි
සෙබළ උත්තමාචාරයෙනි
ජේසු සභාවේ හිස විය
රජ සිහසුන කුරුස ගසය
අති උත්තම ගත සරසන
නිල සාටක කිසිත් නොවිණ
කටු ඔටුන්න මිස නැත වෙන
රන් කිරුළක් හිස පළඳින
බලයේ මුද්දක් නොදැමිණ
රාජ යෂ්ටියක් ද නොවිණ
උල් හෙල්ලය අතෙයි සෙබළ
නිරිඳුන් ළය රැකවල් කළ
මේ උලෙළෙහි රජ දිනිතිය
නිහඬව සිහසුන අසලය
තව දෙන්නෙක් ඒක් වෙලාය
ඒ දෙන්නත් මරියලාය
පිරිමියකුට ඉන්නෙ හිතැති
ගෝලයාය ජොහාන් නැමති

පර්වතයක් බඳු පේදුරු
මේ වෙන විට ඇත වී දුරු
කුරුසිය සිහසුන දෙපසේ
තවත් කුරුස දෙකක් දිසේ
වම් පසෙහිත් දකුණු පසෙත්
ඇණ ගැසිලා දෙන්නෙක් වෙත්
ඒ දෙන්නම වෙති පල් හොරු
මේ මරණෙට තීන්දු කෙරු
හොරා කුරුසෙ වම් පසේ
ජේසුට පවසයි මෙසේ
ඔහේ දෙවියොනම් ඉතින්
ඔහෙත් මිදී අපත් මුදනු දැන්
අනිත් හොරා දකුණු පසේ
අහන් ඒක කියයි මෙසේ
අනේ මිතුරෙ උඹයි මමයි
මිනිමරු පල් හොරුන් නෙමැයි
ඒක නිසා අපි කුරුසේ
මරණෙට පත්වෙමු මෙලෙසේ
අහගනින්කො මේ ඇත්තක්
මැද කුරුසේ නිදොස් කෙනෙක්
තමයි ඇණගසා සිටින්නෙ
ඉරිසියාවටයි මරන්නෙ
බලය ඇත්තො තියෙන බලේ
රැක ගන්ටයි මෙහෙම කළේ
පල් බොරු චෝදනා නැඟුව
වද දී කුරුසේ මරණව
ඊට පස්සෙ ඒ හොර තෙම
ජේසුට හිස හරවා තම
ළංවෙන මරණය අබියස
අයැදීමක් කරයි මෙලෙස
රාජශ්‍රීයෙන් ඒන සඳ
සිහි කළ මැන මාත් සමඟ
කරුණාගුණ හද ඉතිරෙයි

ජේසු ඔහුට උත්තර දෙයි
ඔබට කියමි නිසැක ලෙසම
පාරදීසයේ අදම
ඔබ මා හා සිටින්නෙහිය
ඒ පිළිනය මේ බසෙහිය
ජේසු මසිත් මේ ලෙස වූ
සාන්තුවරයට ඒසැවූ
ඒකම ඒක්කෙනා මෙලොවේ
දීමස් නම් වූ ඔහු වේ
ඒහෙම වුණත් සාන්තුවර
දීමස් යනුවෙන් ගරුකර
අපි ඒතුමා සලකනවද
මතකේවත් පවතිනවද
ශුද්ධ වන්තයන් හට වෙන
දවස් තිබේ වෙන් කරගෙන
ජේසුම පළ කළ නිසැකින
නොසිතනු ඇයි මෙතුමා ගැන
අවුරුද්දක් පාසා හැම
නොවරදාම කඩ නොකරම
ඒළැඹෙන මහ සිකුරාදා
සමරනු නොහැකිදො මන්දා
සාන්ත දීමස් උතුමා
හද බැතියෙන් සිරස නමා
වෙතොත් දොසක් මෙහි පෙනෙන්න
කරුණාකර සමාවෙන්න
දෙවිඳුන් හමුවෙම ගරුකර
ඒළිපිටදිම හොරකම් කළ
පාරාදීසයට ගියත්
දකුණෙ හොරාමය තවමත්
ඕක තමයි අපේ ගතිය
හොඳට කිසිම තැනක් නැතිය
පෙර මෙය අවසන් කරන්ට
හිතෙනව මේකත් ලියන්ට
මට හැඟෙන්නෙ මුළු ලොවෙහිම
මේක තමයි ලොකු හොරකම
කැමැත්ත ජේසුගෙ ඇරගෙන
ලද පාරාදීසේ තැන
සත් දීමස් උතුමාණෙනි
මේ කවි ඔබගේ නාමෙනි.

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

භක්ති ප්‍රබෝධනය




1. ජේසු අනේ ඔබ එදා වින්ද දුක - දේව අම්ම ඉවසුවෙ කෙලෙසේ
   මේ දුක දරන්න ඇගෙ මුදු හදවත් - දේව බලෙන් අප වෙත පෑවේ
2. වාවනු බෑ හද මතකෙට එන විට - උණු කඳුලින් ඇස් බොඳ වෙන්නේ
   සමිඳු පුදන්නට පවුල් පිටින් ගිය - අසරණයන් දිවි බිලි දුන්නේ
3. ඔබෙ ප්‍රතිමාවට විසිරුණ මස් ලේ - අද මොක් පුරයේ හඬ දෙන්නේ
   සමාවන්න ජේසුනි උන් හිටියේ - ඔබ ළඟමයි "අවසාන පැයේ"
4. ඔබෙ උත්ථානය සමරපු දරුවන් - එකවර මොක්පුර රැගෙන ගියේ
   ඔබෙ වත දකිනට දෙව් මව් තුරුලට - එන්නට ඒ සැම භාග්‍ය වුණේ
5. උත්ථානයෙ පිළිරුව වටකරගෙන - මංගල පෙරහැර යන්න තිබේ
   එනමුත් තුති මල් පුදනා මොහොතේ - අනේ අහෝ මේ මොකද වුණේ
6. එකම මළගමකි මළ පෙරහැර ගිය - කටුවපිටිය මුළු ගම්මානේ
   කඳුලක් නැති දෑසක් නෑ දුටුවේ - කටුවපිටිය දෙව් මැදුරු බිමේ
7. දේව මැවිල්ලේ අගය වැනසුවා - නපුරා ලෙහි පපුකමක් නැති
   බිහිසුණු තුවාල සුවකරගන්නට - රෝගීහු තවමත් දුක් විඳිති
8. මව්පිය අහිමිව දරුවන් අහිමිව - තනිවුන හදවත් කදුළු සලත්
   සවියක් වෙමු අපි ඒ දන වෙත අද - තුරුලු කරන් තනිවුණු හදවත්
9. අපට තියන දේ හැකි අයුරින් අපි - බෙදා ගනිමු සොහොයුරු ප්‍රේමෙන්
   මෙවන් දුකක් යලි නොවෙන්න නම් - විවර කරව් ඇස් රට පාලකයන්
10. අප එඩ්රාණන් කාදිනල් උතුමන් - පියකු වගේ අප වෙත ආවේ
    ජේසුනි රැකදෙනු මැනවි එතුමන් - තබා ඔබේ බලගතු හස්තේ

**කේ. ඩේසි පෙරේරා, නෑදුරුපිටිය, කඳාන.**

# "ස්වාමිනී, මොවුන් නොදැන කරන වරදට මොවුන්ට සමාව දුන මැනව"

එදා කල්වාරි කඳු මුදුනේ කුරුස ගසේ එල්ලී සිටි ජේසු සමිඳුන් කුරුස පාමුල දෙස බැලූ විට උන්වහන්සේට දක්නට ලැබුණේ ජේසුස් වහන්සේට උසුළු විසුළු කළාවූ, උන්වහන්සේගේ ශ්‍රී ශරීරයට කස පහර දී මුහුණට කෙළ ගැසුවා වූ ජන පිරිසකි. එමෙන්ම උන්වහන්සේගේ අති බිහිසුණු මරණය දැක සතුටු වන්නට ඔවුන් තුළ තිබුණේ ද පුදුමාකාර පිපාසයකි. කෙනකු මිය යන විට තමන්ට කෙනෙහිලිකම් කළ සැමට, තම සතුරන්ට සමාව දෙන්නේ ඉතාමත් දුර්ලභ පිරිසක් වීම සාමාන්‍ය අත්දැකීමකි. කෙසේ වෙතත් ජුදා සමාජය තුළ එදා කුරුසයේ ඇණගැසුම් කෑ හැම කෙනකුම තම සතුරන්ට, හේවායන්ට ශාප කළා මිස ඔවුන්ට සමාව දානය නොකළ බව කාටත් නොරහසකි. එහෙත් ජේසු සමිඳාණෝ එවන් නින්දිත ඉතිහාසය පරදා යමින් පිලාත්ට, හෙරෝද්ට, හේවායන්ට, පරිසිවරුන්ට, උන්වහන්සේව මරනු යැයි කෑ ඝෝෂා කළ හැම දෙනාට, අවසානයේ තමන් අතහැර ගිය ගෝලයන්ට ද සමාව දුන් සේක.

අපගේ හදවත් පසාරු කරගෙන යා යුතුව තිබුණා වූ ඒ අඳුරු ඇණ පහරවල් උන්වහන්සේගේ ශුද්ධ වූ දෑත් පසාරු කර වේදනාවන් විඳදරා ගනිමින් මානසිකවත් ශාරීරිකවත් හෙම්බත් වී සිටි උන්වහන්සේට සතුරුකම් කළ මිනිසුන් දෙස උන්වහන්සේ නෙත් යොමු කෙරුවේ පුදුම සහගත ලෙසය. යම් හේතුවකින් උන්වහන්සේ විඳි දුක කවුරුන් විසින් හෝ අපට පැමිණෙව්වා නම් අපගේ මුවින් පිටවන වචන මාලාව පිළිබඳ සිතාගන්නටත් අපහසුය. පව්කාර මිනිසුන් රාශියක් වෛරයේ හා පළිගැනීමේ දෙනෙත් යොමාගෙන උන්වහන්සේ දෙස බලා සිටි මොහොතක උන්වහන්සේගේ ප්‍රේමණීය දෙනෙත් තුළ දිස් වූයේ පියාණන් වහන්සේගේ අසීමිත වූ ආදරයයි. ඒ අසීමිත ආදරය සඳහටම පරිපූර්ණ කරනු සඳහා ඒක ජනිත පුත්‍රයාණන් වූ ජේසු සමිඳාණෝ කුරුසියේ මරණය වැළඳ ගත් සේක. අනන්ත වූ අප්‍රමාණ වූ දුක් වින්දා වූ උන්වහන්සේ කුරුසිය මත හිඳිමින් පැවසූ පළමු වදන සමාවයි. දෙවිඳුන්ගේ සමාවේ වරප්‍රසාදය ක්‍රිස්තුස් වහන්සේ තුළින් නොදැන පව් කරන අයටත්, දැන දැනත් පව් මගෙහි සැරිසරන සැමටත්, පසුතැවීම තුළින් ලබාගත හැකි වීම කුරුසියේ අභිරහසයි.

මොහොතක් අපි අපේ ජීවිත දෙස හැරී බලමු. අප තවමත් ජීවත් වන්නේ පළිගැනීම, අසමගිය රජයන සිරමැදුරු තුළ නොවේද? වෛරය, ඊර්ෂ්‍යාව වැනි දුර්ගුණ නිසා තුවාල වූ අතීතය සුවකර ගත හැකි හොඳම ක්‍රමය සැබෑ ආදරය තුළ සමාව දීමයි. උන්වහන්සේ මේ පැවසූ වදන් සැබවින්ම අපට අභියෝගයකි. ජේසු සමිඳාණන් අප සැමගේ අසීමිත පාපයට සමාව දානය කළා නම්, අප අන් අයගේ සීමිත පාපවලට සමාව නොදෙන්නේ මන්ද?

**කේ. ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
**ආචාරිණි, සිරිකුරුස විදුහල, ගම්පහ.**

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ
කවි / ගීත / නිසඳැස් /
කෙටි කතා / ලිපි / සිතුවිලි
ආදි වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
පන්තිභාර ගුරුතුමාගේ /
ගුරුතුමියගේ අත්සන ඇතිව
ඒ නිර්මාණ අප වෙත යොමු කරන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

# කල්වාරි ගමන - අප දිවි ගමනයි

"කල්වාරියෙ කුරුසිය මට එපා
කියා හඬා කෑ ගසන්න සිතුණා...."

කල්වාරියට ජේසුස් වහන්සේ පියමැනූ ගමනත් සුන්දර, සැප පහසු සහිත ගමනක් නොවේ. එය කටුක, අසීරු ගමනකි. මේ අසීරු වූ කල්වාරි ගමන ජේසුස් වහන්සේ පිය මැන්නේ මුළු මිනිස් සංහතිය උදෙසාය. කසයෙන් තළා, තම හිස් කබල පසාරු කරන තරමට උල් වූ කටු ඔටුන්නක්ද දමා, මහා බර වූ කුරුසියක් ද කර පිට තබාගෙන, ගොල්ගොතාව දක්වා පැමිණියේ අපට ඇති ආදරය නිසයි. ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ ජීවිත කාලයේ දී උන්වහන්සේ, ශීත කරන ලද කාමර වල නොසිට, දේව රාජ්‍ය පතළ කිරීමට ගම්නියම්ගම් පුරාම ගොස් දේව තාත්තාගේ ශු. වචනය දේශනා කර, ජනතාව තමන් වහන්සේ වෙත හරවා ගැනීමට දැඩි මහන්සියක්, කැපවීමක් කළ සේක. එදා ජේසුස් වහන්සේ තම පියාණන් වෙත ගියේ සැපපහසු ලෙස නොව, වද තිස් දෙකක් විඳ, කල්වාරියේ කුරුසිය මත ඇණ තුනකින් එල්ලීමෙන්ය. සමිඳාණන් වහන්සේගේ ජීවිතයට සහ දේව මාතාවන් වහන්සේගේ ජීවිතයට එල්ල වූ කුරුස අපමණය. එහෙත් ඒ බාධක සමඟ දෙවියන් වහන්සේ තුළ යැපෙමින්, තම දිවි ගමන සාර්ථක කර ගෙන ස්වර්ගීය සම්පත් දිනාගත් සේක. අද **සමාජය තුළ, සිටින කතෝලික ජනයාට එල්ල වන පළමු බාධකයෙන්ම තම ආගම දහම අතහැර දමා අන්‍යාගමිකයන් පසුපස දුවති. එසේ නම් අපත් අපට එල්ල වන්නා වූ කරදර බාධක හමුවේ නොසැලී, කුරුසිය දරාගෙන අපගේ කල්වාරි ගමන පිය මනිමු.**

අප ශුද්ධ වූ බයිබලය මොහොතකට මෙනෙහි කළහොත් ශු. මතෙව් තුමාගේ සුවිශේෂයෙන් ඔප් නංවනුයේ, **"පටු දොරටුවෙන් ඇතුළු වන්න, විනාශයට යන දොරටුව විශාලය. පාරත් පළල් ය. එයින් ඇතුළු වන්නෝ බොහෝය. එහෙත් ජීවනයට යන දොරටුව පටුය. පාරද අවහිරය. එය සොයාගන්නෝ ස්වල්ප දෙනෙක් පමණකි"** (මතෙව් 7:13 - 14). මොහොතකට සිතමු

# ළමා ප්‍රබෝධනය



අප යන්නා වූ මඟක දෙපැත්තට බෙදී එක් මඟක් පළල්ය. සුන්දරය. රමණීය ය. අනෙක් මඟ කටුපඳුරු, ගල්බොරලු සහිත පටු මගකි. අප ඒ මාර්ගවලින් කුමක් තෝරා ගන්නද යන්න අපට ප්‍රශ්නයකි. ඔබ දේව ජනතාවක්. ඔබේ මරණින් පසු ඔබ, මම බලාපොරොත්තු විය යුත්තේ, සදාතන වූ ස්වර්ගීය රාජධානියයි. පූජකවරුන් තම පූජකවරයේ දී, දෙවියන් වහන්සේ ඉදිරියේ පොරොන්දු දෙන්නේ, "උන්වහන්සේට අයත් කිසිදු ආත්මයක් යක්ෂයාට නොදෙන බවටය." අප කතෝලික ජන පිරිසක් සේ සමිඳු සෙවණෙහි කල් හරිමු. **ජීවිතයට කුරුස එමටය, දරා ගන්නට ශක්තියක් නැත. එසේ වන්නේ දෙවියන් වහන්සේගෙන් නොයැපෙන නිසා බව ස්ථිරය.** ජේසු එදා කල්වාරි ගමන් ඇරඹුවේ, තම පියාණන් සමඟය. අපත් අපගේ දුක් අමාරුවලදී, "අනේ ජේසුනී මට මේ කරදර එපා..." යැයි නොහඬා, ජීවිතයේ අවසන් ජයග්‍රහණය වන ස්වර්ගය කරා යෑමට අවශ්‍ය වරම් පතමු.

ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේට කිට්ටුවෙන් සිට, යාච්ඤාව තුළ එම කුරුස ගමන ජයග්‍රහණය කළ සේක. **අද කතෝලික පවුල් ගත් කළ බහුතරයක් යාච්ඤාවෙන් තොරය. අපගේ ජීවිතයේ කම්කටොලු, බාධා දරා ගැනීමට ශක්තියක් නැති වන්නේ යැදුමෙන් තොර වූ ජීවිත නිසා ය.** අප දෙවියන් වහන්සේට ළං වන්නට වන්නට, අපට දුක දොම්නස, කරදර, බාධක අපමණය. ඒවා පරාජය කොට දෙවියන් වහන්සේට ළං වනවා මිස, "අනේ මට කරදර වැඩියි" කියා දහම අතහැර යාම මහා අනුවණ ක්‍රියාවකි. එවන් වූ අනුවණ ක්‍රියා කරනුයේ, යාච්ඤාව නමැති දුරකතනයෙන් දෙවියන් වහන්සේ හා සම්බන්ධ නොවූ අයය. ඒ යාච්ඤාවට සමවැදී සිට, දේව හඬ අප වෙත ගලාගෙන විත් අප ගමන් කළ යුතු පටු පාර සොයා දෙන බව නොඅනුමානය. යාච්ඤාව තුළ පමණක් දෙවියන් වහන්සේව අත්දකිමු. නිවසේදී කරන සුළු යාච්ඤා සහ

18 වන පිටුවට.....

# පුංචි විකුම්



ප්‍රභාත් නවය වසරේ ඉගෙනුම ලබන සිසුවෙකි. පන්තියේ දී මෙන්ම, ගමේදී ද ඔහුට මිතුරු මිතුරියෝ රාශියක් සිටියෝය. හැම කෙනකුගේම හිත දිනා ගෙන වැඩ කටයුතු කිරීම ඔහුගේ හොඳ පුරුද්දකි. එනිසා දුප්පත් පොහොසත් භේදයකින් තොරව ඔහු වටා මිතුරෝ ඒකරාශී වූහ. දහම් පාසලේදීත්, පාසලේදීත් පොදු කටයුතු සංවිධානය කිරීම පැවරෙන්නේ ප්‍රභාත්ටය. ඒ කටයුතු වගකීමෙන් ඉටු කරන බව ගුරුවරු ද හොඳින් දැන සිටියහ. ඒ හේතුවෙන් ගුරුවරු, වැඩිහිටි සැමගේ හොඳහිත දිනා ගැනීමට ඔහු සමත් විය.

අම්මා ගෘහණියකි. තාත්තා රජයේ සේවකයෙකි. දරුවන් හතර දෙනකුගෙන් යුත් පවුලේ වැඩිමලා ප්‍රභාත් ය. ගෙදර අග හිඟ කම් නොතිබුණා නොවේ. ඒත් ඒවා කළමනාකරණය කර ගනිමින් දරුවන්ගේ පාසල් කටයුතු නියමිත ලෙස ඉටු කිරීමට දෙමාපියෝ වග බලාගත්හ. මේ හැම විටකදීම පවුලේ වැඩිමලා හැටියට ප්‍රභාත් අරපිරිමැස්මෙන් කටයුතු කිරීම නංගිට හා මල්ලිලා දෙදෙනාට මහඟු ආදර්ශයක් විය. අවශ්‍ය දේට පමණක් ගෙදරින් මුදල් ඉල්ලා ගත්තත්, අනවශ්‍ය වියදම් නොකළේ ය.

පාසලේ ප්‍රභාත්ගේ හොඳම යාළුවා වූයේ නිශාන්ත ය. නිශාන්තගේ පියා රිය අනතුරක් නිසා ආබාධිත තත්ත්වයේ පසු වූ හෙයින්, ඔහුගේ ජීවිකාව වූයේ ලොතරැයි පත් විකිණීමයි. ඔවුන්ගේ අසරණ තත්ත්වය ප්‍රභාත් හොඳහැටි දැන සිටියේ ය. පසුගිය දා පාසැල් ක්‍රීඩා උත්සවය පැවැත්වුණි. 16න් පහළ මීටර් සියය (100) තරගයෙන් ප්‍රථම ස්ථානය හිමි වූයේ ප්‍රභාත්ට ය. ඒ ඔහු ක්‍රීඩාවට දැක්වූ දක්ෂතා නිසාය. ඒ සඳහා ඔහුට සහතික පත්‍රය සමඟ රුපියල් හත්සිය පනහක (රු. 750) පාසැල් පොත් ගැනීම සඳහා වවුචරයක් හිමි විය.

වවුචරය අතට ගත් ඔහු දෙපාරක් සිතුවේ නැත. වවුචරය නිශාන්තට දුන්නේ ය. නිශාන්ත එය ප්‍රතික්ෂේප කරද්දී, එය නොගන්නේ නම් නිශාන්ත සමඟ තරහ වන බව ප්‍රභාත් තරයේ කියා සිටීම නිසා නිශාන්තට එය බාර ගැනීමට සිදුවිය. ඔහු එය බාරගත්තේ දහස් වරක් ස්තුති කරමිණි. ප්‍රභාත්ට ඊට වඩා සතුටක් නැත. ඔහු පිම්මට ගෙදර දිව්වේය. ගෙදර ගිය විට අම්මාට තාත්තා මෙය පැවසීය. ඔවුන් ඔහුව සිප වැළඳ ගෙන ප්‍රභාත් කළ යහපත් ක්‍රියාව ගැන ඔහුට ස්තුති කළ අතර, ඔවුන්ට එය මහත් ආඩම්බරයක් විය.

ආදර දුවේ - පුතේ ප්‍රභාත් පමණක් නොවේ, ඔහුගේ අම්මා - තාත්තා අප හැමටම ආදර්ශයක් නේද? යහපත් මිනිසුන් වන්නට අපිත් අදිටන් කර ගනිමු.

**සූරිය මාමා**

17 වන පිටුවෙන්.....


යාච්ඤාවේ උසස් ම ස්ථානය හිමි වන දිව්‍ය යාගය තුළ දෙවියන් අත්දකිමු. ගමනක අනිවාර්යයෙන් කෙළවරක් තිබිය යුතු සේම, කතෝලික අපගේ දිවි ගමනේ අවසන් මුදුන වන ස්වර්ගය කරා පිය නැඟීමට දේව වරප්‍රසාද පතමු. යාච්ඤාව තුළ ජීවිත කුරුසිය දරාගෙන, කුරුසිය මඟදී අත නොහැර, පටු මාවතේ ගමන් කර ස්වර්ගීය පියාණන් වෙත යාමට අවශ්‍ය වරම් පතා යදිමු.

"කල්වාරියේ කුරුසිය මට එපා කියා කැඟසන්න එපා..."

**බුද්ධික සඳරුවන්**

**11-B, සාන්ත මරියා විදුහල, මීගමුව**

## ප්‍රහේලිකා අංක - 58




**හරහට**

1. මෙලොව එළොව යා කළ උත්තමයාණෝ.
3. මෙතුමා වැඩිය දේශය යැයි ලංකාව නම් කෙරේ.
5. ලෝ පරසිඳු ලෝක සිතියමේ පුංචි තිත.
7. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහයෙකි.
9. පිරිසක් අතර ඇතිවන ගට්ටනය මෙලෙස හඳුන්වයි.
10. "පූරුවේ පවක්" යන්න පද පෙරළියේ දී මෙම වචනය හමුවේ.
11. පුෂ්පය යන්නෙන් අරුත් ගන්වයි.
12. හාල් වර්ගයකට කියන වචනයකි.
13. අත්පන්දු ක්‍රීඩාවේ එක පිළකට අයත් ක්‍රීඩකයින් ගණන.
14. වැදි භාෂාවේ කොලුවා, ගැටයා යයි හඳුන්වන්නේ මෙලෙසය.
15. සිරිපාදයට යන මේ අයගේ "තටු මත මගෙ පුතු නළවන්න" යැයි ගරු මර්සලින් ජයකොඩි නි.ම.නි. පියතුමා ලීවේය.
17. අන්දරේ සම්බන්ධ කථාවක කියැවෙන සුදුවැලි මේවාය.

**පහළට**

1. "සිරකරුවෝද මනුෂ්‍යයෝය". ඔවුන්ගේ පරිපාලන කටයුතු වලට මොවුන් හවුල් වේ.
2. ධීවර ආම්පන්න අතරේ මසුන් අල්ලා ගැනීමට යොදාගන්නා විශාල දැල.
3. පසුගිය කාලයේ මහත් ආන්දෝලනයට ලක් වූ කාන්තා ඇඳුමකි.
4. සෘණ නොවන එකතුව.
6. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස හඳුන්වන්නේ මෙම සතාය.
7. මියන්මාරයේ පෙර නමයි. වඩු මඩුව හා සම්බන්ධ උපකරණයකි.
8. ජේසුස් වහන්සේ අන්‍යරූප විලාස වූ විට ඇඳුම බැබලුනේ මේ වර්ණයෙනි.
12. මලක් පිපෙන්නට පෙර පොහොට්ටුව මෙනමින් හැඳින්වේ.
13. හත සඳහා මෙම නම යෙදේ.
14. විවිධ පාටවලින් යුත් මල් වර්ගයකි. මේ ගස කෙසෙල් ගසට නෑ කම් කියයි.
15. මුස්ලිම් භක්තිකයන් හජ්ජි උත්සවය පවත්වන්නේ මෙය දැකීමෙන් පසුවය.
16. "අග්නි" යන්නට යෙදෙන තවත් නමකි.

**සැකසුම :ගරු. ලක්මාලි ප්‍රනාන්දු**
**පැවිදි සොහොයුරිය ශු.ප.**
ශු.පවුලේ පැවිදි ආරාමය, කමරගොඩ.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2020 අප්‍රේල් 30 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයින් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවලින්, රු.1000.00, රු. 750.00, රු. 500.00** බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල හා පාසලේ ලිපිනය සඳහන් කර එවන්න.

ප්‍රහේලිකා අංක - 58
"ළමා ප්‍රබෝධනය".
අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.

# ශුද්ධ වූ සණ්ටාව

1. ශුද්ධවූ සණ්ටාව
උදය යාච්ඤාව
මාංසගත වේලාව
දැන් තමා දිව්‍ය පූජාව

2. උදෑසන දහවල
හිරු බට සවස් කල
සීනු නද අසන කල
තිලින්දාදිය මෙතුන් වේල

3. දෙව් පුතු පිළිසිඳුණා
දාසීමි කියවුණා
වචනයෙන් මිනිසා වුණා
සීනුවත් තෙවර වැදුණා

4. ප්‍රසාද ස්නාපෙනට
දරුවකු ගෙනේ දෙව් මැදුරට
මම ඔබ නාවමි කී විට
සීනු නද දේ සතුට පළකොට

5. නැසියන් පිරිවරාගෙන
දෙපළ එති කරා පුදසුන
අපි වෙන් නොවෙමු කිසි දින
සීනු හඬ දේ මහත් සතොසින

6. තාලය වෙනස් වී
රාවය දුක් බර වී
නාමය මළසීනු වී
කවුද දන් නෑ ඇත්තෙ නැති වී

7. වෙනදා ආවේ දෙපයින
අද එන්නේ පෙට්ටියකින
හැම දෙන සුදු ඇඳගෙන
සීනුවත් සැලේ සෝකෙන

8. මහ බ්‍රහස්පතින්දා
හවස සිට නිහඬ මන්දා
මරණින් නැගිට හන්දා
සීනු සද්දේ වැඩියි ඉරිදා

9. අප්‍රියෙල් විසි එක
කිතු දනන් ලේ විලක
සුදුවරුය ඔහු එකිනෙක
සීනු නිසලයි විපත දැක දැක

10. පරලෝ රැජිනියනි
ජයවේ ආනන්දයෙනි
පෙර කිවූ පරිදිනි
මරණින් නැගිටි සමිඳුනි

**පිලීෂන් අබයකෝන්,**
**හැඳල.**

# පැවිදි දිවිය

පැවිදි ජීවිතය යනු ජීවිතය මුළුමනින්ම දෙවියන් වහන්සේට කැපවුණු ජීවිතයකි. විශේෂ දේව කැඳවීමකි. පැවිදි ජීවිතය ගත කරන සියලුදෙන දේව රාජ්‍ය ගොඩනැගීමේ කාර්යයට සහය දක්වති. පැවිදි ජීවිතයක් ගත කිරීමට කැමති අයට ගැඹුරු පුහුණුවක් ලැබිය යුතුය.

පැවිදි ජීවිතය උතුම් දේව කැඳවීමකි. පැවිදි පංති කොටස් දෙකකට බෙදේ. එනම්, පැවිදි පූජක සහ පූජක ජීවිතයට නොයන පැවිදි සහෝදරයන් සහ පැවිදි සහෝදරියන් ය. පැවිදි ජීවිතය ගත කරන අය අධ්‍යාපන, සමාජ සේවා ආදී ක්ෂේත්‍රවල සේවය කරති. එක් එක් පැවිදි නිකාය වල ආරම්භයේ පරමාර්ථ අනුව ඔවුහු සේවය කරති. ඒවා මගින් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මදූත සේවාවට ඔවුහු දායක වෙති.

පැවිදි ජීවිතය ඉතා උතුම් ජීවිතයකි. ගිහියන් පැවිදි ජීවිත ගතකරන අය වෙනුවෙන් යාච්ඤා කළ යුතු අතර ඔවුන්ට ගරුකළ යුතුය. පැවිදි ජීවිතය ගත කරන අය සියලු ලෞකික ආශා දමනය කළ පිරිසකි. ඔවුන් දේව රාජ්‍ය වෙනුවෙන් ඉතා ඉහළ සේවයක් කරති. පැවිදි කැඳවීමක් ලැබීමට අපි දිනපතා යච්ඤා කරමු.

**නෙහාසා සෙව්වන්දි**
**8 ශ්‍රේණිය A, සිරිකුරුස විදුහල, ගම්පහ.**

# කැඳවීමක් තුළ කැඳවීමක් ලද නි.ම.නි. පියතුමා

ලොව මැවුම්කරුවාණන් පස් පිඩක් ගෙන තම සිතේ ඇඳි සිත්තමට මැටි පිඩ අඹමින් එයට ජීවනයේ හුස්ම දෙමින් තම මැවීම දෙස බලා එයට ආශිර්වාදය දානය කරමින් එය වර්ධනය වන්නට සලස්වා සිය සැලැස්ම මිහිමත දිග හැරෙන්නට සැලැස්විය. 1886 මැදින් මස 7 වන දින යාපනයේ "පැන්ඩියන්තාල්" නම් වූ සුන්දර ග්‍රාමයේ බස්තියන් පිල්ලේ හා ලූසියම්මාල් නම් බැතිමත් දෙමව්පියන්ගේ දෙවන දරුවා ලෙස උපත ලද ඇන්තනි, පසුව තෝමස් නමින් ප්‍රකට වූ අප පියතුමාගේ භූමදානය එදිනට සිදුවෙතැයි ග්‍රාමවාසීන් සිතුවත්, දෙව් ආදරයත් මව් සෙනෙහසත් තුළ දරුවාට නව ජීවයක් ලැබිණි.



කුඩා අවදියේ පටන් අත්වැල් බැඳගත් රෝගීභාවය මරණය දක්වාම ඔහු අතහැර නොගිය කලණ මිතුරෙකි. යාපනයේ සා. චාල්ස් දෙමළ පාසලින් මූලික අධ්‍යාපනය නිමාකළ තෝමස් වැඩිදුර අධ්‍යාපනය සඳහා යාපනයේ සා. පැට්‍රික් විදුහලට ඇතුළත්ව, පසුව සිය පියාගේ දැඩි විරෝධය හමුවේ නොසැලී මවගේ සහයෝගය මත පියාගේ සිත් හරවාගෙන 1905 දී සා. මාටින් දෙව්සත්හලට ඇතුළුව කුණාටු සුළි සුළං මාර්ග බාධක ඉදිරියේ නොසැලී 1912 දුරුතු මස 6 වන දින යාපනයේ ආසන දෙව්මැදුරේදී අති උතුම් ජූලේන් හිමිපාණන් අතින් පූජකවරයට ඔසවන ලදී.

නිතර රෝගී වන නවක පියතුමාව විවේක සුවය සඳහා යවන ලද්දේ සා. පැට්රික් විදුහලටයි. එහිදී දේශීය සහා ඉතිහාසය ගැන ඉගෙනගත්තෙන් තම අභ්‍යන්තර ආශාව භාවනාශීලී පන්තියක් පිහිටු වීම ගැන තම මිත්‍ර පියතුමා සමඟ නිතර කථා කරමින් අදහස් විමසන අවධියේ 11 වන සසුන් පිය විසින් (Reveim Ecclesias) විශ්ව ලේඛනය මගින් පෙරදිග රටවල සිත් හැරීම සඳහා යාච්ඤාවේ ධ්‍යානශීලී නිකායක් ඇරඹීමට ඇරයුම් කර තිබිණි.

තම මිත්‍ර පියතුමා යාපනයේ රදගුරුතුමන් ලෙස පත් වූ මේ කාලයේ මෙයට සුදුසුම පුද්ගලයා ලෙස තෝමස් පියතුමා පත් කරමින් සිය ආශිර්වාදය දානය කරමින් සියල්ල දේව හස්තයට බාර දෙමින් නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ සහෝදර කණ්ඩායමක් සූදානම් කර වර්ෂ 1927 නිකිණි මස 1 දා තෝලගට්ටියට ප්‍රවිෂ්ට විය.

තමා විසින් පිහිටුවීමට යන නිකාය බැහැපත්කම නමැති මහා පර්වතය මත ගොඩනැගීම එතුමාගේ ඇතුළත පෙළඹීම විය. එදා සමාජය තුළ කුල සහ පන්ති භේද ඉස්මතු වී පැවති කාලයකි. එහෙත් අප පියතුමා ඉදිරියේ භේදයකට කිසිදු ඉඩක් නොවීය. නිරන්තර යාච්ඤාව, පශ්චත්තාපය, පොළොව එලහරිත කිරීමෙහිලා වෙහෙසෙන හස්ත කර්මාන්ත, දෙවිඳුන් හා නිරන්තර සබැඳියාව තුළ ඇතිවන නිහඬ බව ජේසු සමිඳුන් ජීවත් වූ නාසරතය මෙහි පැමිණි සැමට දැකගත හැකිය. වර්ෂ 1928 නවම් මස 2 දින යාපනයේ රදගුරු අති උතුම් ගියෝමාර් නි. ම. නි. හිමිපාණන් විසින් ආසිරි ගන්වා ජපමාල පියතුමන්ලාගේ නිකායද නොයෙක් අපහසුතා මධ්‍යයේ ශු. ජුසේ මුනිඳුන්ගේ රැකවරණය යටතේ ශු. පවුලේ නිකායේ ජීන් මාරි මව්තුමියගේ සහයෝගයෙන් තාපසිකාවන්ගේ පන්තිය ද පිහිටුවන ලදී. ඒ 1950 නිකිණි මස 22 දිනය.

ජපමාල තාපස නිකායේ නිර්මාතෘ දේව සේවක අති ගරු බී. ඒ. තෝමස් නි. ම. නි. පියතුමා සුදු සබයේ ශුද්ධවරයන් අතරට එක්වීමේ දිනය විගස උදාවේවා යයි අපි පතමු, යදිමු.

**ගරු ප්‍රදීපිකා පැව්දි සොහොයුරිය,**
**ජපමාල තාපස ආරාමය, තලවිල.**

# මහ බ්‍රහස්පතින්දා සිදු වූ මහ සිදුවීම

දේව වන්දනා වසර තුළ කැපී පෙනෙන අද්විතීය දින කිහිපය අතුරින් එකක් ලෙස මහ බ්‍රහස්පතින්දා නම් කිරීම ඉතා වැදගත් යැයි අපි දනිමු. මහ බ්‍රහස්පතින්දා දින දිව්‍ය පූජා යාගය තුළ මුණගැසෙන සහ ඉස්මතු වන "පාද ධෝවනය" කිරීම යන මෙම සංකේතාත්මක ක්‍රියාව තරම් ප්‍රබල වටිනාකමක් ලබා දෙන කිසිදු සිදුවීමක් දේව වන්දනා වසර තුළ නොමැති තරම්ය. හැම දිව්‍ය පූජා යාගයක් තුළම "පූප කැඩීම" සංකේතාත්මකව ස්වාමින් වහන්සේගේ ශ්‍රී කුරුසය මත දිවි පිදීම අරුත්ගන්වන බව දනිමු. මෙය හැම දිව්‍ය යාගයක් ඔස්සේම නිරූපණය වන්නකි. එනමුත් "පාද ධෝවනය" වර්ෂිකව මුනගැසෙන ප්‍රබලතම සංකේතාත්මක වටිනාකමක් මුසු කරන ඉරියව්වක් ලෙස විද්වත්තු ඉදිරිපත් කරති.

ජුදා ජනතාව සමරන ලද මංගල්‍යයන් අතුරින් පාස්කුවට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ඊට හේතුව නම් "පාස්කුව" සියලු මංගල්‍යය අතර ප්‍රධානම මංගල සැමරුම වීමයි. මේ මංගල්‍යය අදියර දෙකක් ඔස්සේ ජුදා ජනතාව සිහිපත් කළහ.

1. පාස්කු බැටළුවා දේව මාලිගයේ යාග කිරීම.
2. යාග කළ බැටළුවා රාත්‍රි භෝජනය සඳහා සූදානම් කර ගැනීම.

මේ භෝජනය පාස්කු භෝජනය ලෙස ප්‍රචලිත වන බව ද අපි දනිමු. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් සමඟ මේ පාස්කු භෝජනයට සහභාගී වූ බව පැහැදිලි ලෙස ශුද්ධ ලියවිල්ල අපට සිහිපත් කරයි. **"නුමුහුන් රොටී මංගල්‍යයේ පළමු වන දින ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතට අවුත් පාස්කු භෝජනය වළඳන පිණිස අප කොතැන පිළියෙළ කරනවාට ඔබ කැමති සේක්දැ යි ඇසූහ" (මතෙව් 26:17).**

මේ පසුබිම තුළ ස්වාමින් වහන්සේ "දිව්‍ය සත්ප්‍රසාදය" සහ (නිල) "පූජාත්වරය" යන සක්‍රමේන්තු ද්විත්වය ස්ථාපිත කළ බව දනිමු.

**"මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" (ලූක් 22:19)** යන්න දිව්‍ය සත්ප්‍රසාදය යන සක්‍රමේන්තුව පාදක වූ ප්‍රධානතම ශුද්ධ ලියවිලි පාඨය ලෙස අපි දනිමු.

මහ බ්‍රහස්පතින්දා දිව්‍ය පූජා යාගය ඔස්සේ අප මතකය අවදි කරනුයේ උන්වහන්සේ කුරුසිය මත තම ජීවිතය පූජා කිරීමට පෙර දින පවත්වන ලද පාස්කු භෝජන අවස්ථාවේ දී තම ශ්‍රාවකයන්ගේ පාද ධෝවනය කළ බව ද ආවර්ජනය කරමිනි.

**"රාත්‍රී භෝජනයෙන් පසු උන්වහන්සේ නැගිට තම සළුව ගලවා තබා තුවායක් ගෙන ඉනවටා බැඳගත් සේක. ඉන්පසු උන්වහන්සේ භාජනයකට වතුර වත්කොට ශ්‍රාවකයන්ගේ පාද සෝදන්නටත්, තමන් ඉන බැඳගෙන සිටි තුවායෙන් පිස දමන්නටත් පටන් ගත් සේක" (ජුවාම් 13: 4-5).**

සමදර්ශක සුවිශේෂක කතුවරු, (මාක්, මතෙව්, ලූක්) මෙහිදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ බව අවධාරණය කරති. භෝජන යථාර්ථයට මුල්තැන ලබාදෙන අතර සුවිශේෂක ජුවාම් තුමා මෙහිදී පූර්ණ අවධානය යොමු කරනුයේ "පාද ධෝවනය නමැති ක්‍රියාවටය". සුවිශේෂක ජුවාම් තුමාට අනුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සම්බන්ධව කතිකා කිරීමට ඒ සුවිශේෂයේ සය වන පරිච්ඡේදය වෙන් වී ඇති බව ද දනිමු.

තවද පාද ධෝවනය කිරීම ජේසුස් වහන්සේ සමඟ ජනිත වූවක් නොව උන්වහන්සේගේ පැමිණීමටත් පෙර මෙය පැවති බවට සාක්ෂි ඇත. යම් අමුත්තෙක්/ ආරාධිතයෙක් නිවසට පැමිණි කළ ඔහුගේ පාද ධෝවනය කිරීම ඒ ගෙදර සිටි සේවකයා / වහලා විසින් සිදු කරන ලදී. ඉන් අනතුරුව ගේ තුළට පැමිණීමට ඇරයුම් ලැබුණි. එනමුත් ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ පාද ධෝවනය කිරීමෙන් මීට අලුත් අර්ථ කථනයක් ලබා දුන් සේක. තම ශ්‍රාවකයන්ගේ පාද ධෝවනය කිරීම මගින් පැවති චාරිත්‍රය මුළුමනින්ම උඩුයටිකුරු වූ බවද පැහැදිලිය.


25 වන පිටුවට.....

# ආදරයේ අවශ්‍යතාවය

ආදරය ඔබ තුළ නොමැති නම්,
තමා සුදනෙක යැයි මාන්නයෙන්
කෙන්ද කන්ද ලෙස
අනුන්ගේ වරද දකිමින්
ඔවුන් ගැන ද්වේෂයෙන් පෙළෙන්නෙහි ය.
ආදරය ඔබ තුළ නොමැති නම්,
අනුන්ගේ වේදනා ඔබට නොදැනේ.
එහෙත් ඔවුන්ට හිමිවන සැපත
ඔබ තුළ ඊර්ෂ්‍යාව පුබුදයි.
ආදරය යමකු තුළ නොමැති නම්,
ඔහුට හිමිවන
කීර්තිය, බලය හා ධනය
සාමූහික විපත්තියකට හේතුවන අයුරින්
ඔහුගේ පටු වාසිය තකා
උපයෝගී වේ.

ඔබ තුළ ආදරය නොමැති නම්,
බලවතා දුබලයාව පෙළන විට
එහි අසාධාරණය ඔබට නොදැනේ;
බලවතාව සාධාරණය කරමින්
ඔහුගේ ප්‍රසාදය දිනාගනු පිනිස
ඔබ ද අහිංසකයාට ම බැණවදී
ආදරය ඔබ තුළ නොමැති නම්,
බලවතා කුමන වරද කළ ද,
නිවැරදි යයි සාධාරණය කරමින්
ඔබ ඔහුව
මුරුංගත්තේ තබාගන්නහු ය.

විනෝදය ඇතුළුව
ඔබට අවශ්‍ය සියල්ල ම
කොතෙක් යහමින් ඇතත්
ආදරය ඔබ තුළ නොමැති නම්
තණ්හාවේ අසහනය මිස
සිතේ සහනය ඔබට අහිමි ය.
ආදරය නොමැති නම්,
සවන් දෙන බව දැකිය හැකි මුත්
ඇතැම් දේවල් කොතෙක් කීව ද
හිතට යන්නේ නැති ය.
ආදරය ඇත්නම්
වචන නොමැතිව වුව ද
සිතින් සිත විනිවිදව පෙනෙනු ඇත.



ආදරය තිබේ නම් ඔබ තුළ
මාන්නයේ මහ බර
සැහැල්ලු වනු ඇත.
ඇසුරුකරන්නන් විඳින වේදනා
ඔබට ද දුකක් වනු ඇත.
ඔවුන්ට ලැබෙන සහනය
ඔබට ද සතුටක් වනු ඇත.

ආදරය තිබේ නම් ඔබ තුළ
ඔබෙන් අනුන්ට සිදුවන කරදර
අවම කරගැනීමේ වුවමනාව
ඔබ තුළ පවතිනු ඇත.

ආදරය තිබේ නම් ඔබ තුළ,
එයම ඔබේ ආගම වන්නේ ය.
එවිට ජාතිය මනුෂ්‍ය වී,
ඔබ කරන දේශපාලනය
නිරුත්සාහයෙන්
ඉදිරියට යනු ඇත.

ආදරය තිබේ නම් ඔබ තුළ,
ආගමාලයෙන් ද
ජාත්‍යාලයෙන් ද
දේශ ප්‍රේමයෙන් ද
ගෝත්‍රවාදයෙන් ද
සංස්කෘතික ගැතිකමින් ද
දේශපාලන පක්ෂග්‍රාහිත්වයෙන් ද
මතවාදමය ආධානග්‍රාහිත්වයෙන් ද
නිදහස් වී
ඔබ නැවුම් වනු ඇත.
පවිත්‍ර වී විවෘත වී
ඔබගේ සිත සොඳුරු වනු ඇත.

ආදරය තිබේ නම් ඔබ තුළ,
ඔබගේ චින්තනය ස්වාධීන වනු ඇත.
ඔබගේ කොන්ද ප්‍රාණවත් වනු ඇත.
ඔබගේ හෘදයසාක්ෂිය සජීව වනු ඇත.

**සපුගස්කන්දේ රංජිත්**

# මීසම් සේවාව තුළින් අපි එතෙර වී ගැලවෙමු

කුච්චවේලි මීසම කොළඹ - මට්ටක්කුලියේ සිට කිලෝ මීටර 294 ක් දුරින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදු ප්‍රදේශයේ පිහිටා ඇත. ත්‍රිකුණාමලය පදවියට අයත් මෙම මීසමේ ජීවත් වන කතෝලිකයන් බෝපිටිය, මීගමුව, වෙන්නප්පුව, හලාවත, පුත්තලම සහ වෙනත් ප්‍රදේශ වලින් 1961 දී පමණ ප්‍රථමයෙන් මෙහි පැමිණ ඇත්තේ සංචාරක ධීවරයන් ලෙසය. එවකට කිතුනු දහම හා බද්ධව පැවති ඔවුන්ගේ ආධ්‍යාත්මික ජීවන රටාව හේතුකොට ගෙන කතෝලික ආගම හොඳින් අදහා, ඒ නිසාම හොඳ මසුන් රාශියක් මහ මුහුදෙන් අල්ලාගෙන ඉතාමත් සමෘද්ධිමත් සහ තෘප්තිමත් ජීවිත ගත කළ බවට කල්ලරාව ජනතාව අද ද සාක්ෂි දරති. ඔවුන්ගේ ඉපැයීම් නිර්ලෝභව අන් අය සමඟ බෙදා ගත් බව ද එවකට කොලු ගැටයකු වූ අද අප පදවියේ අනුනායක තැන්පත් අතිගරු කිංස්ලි රොබට් පියතුමා මා සමඟ පවසා ඇත. අප දේශපාලනඥයන්ගේ අනුවණකම් හා දුර්වලතා හේතු කොටගෙන ඇති වූ ජනවාර්ගික යුද්ධය හේතුවෙන් කල්ලරාව ප්‍රදේශයේ කිතුනුවන් 45 දෙනකුගේ වටිනා ජීවිත අහිමි වී ගියේ යුද්ධයේ බියකරු බව අපට ද උරුම කර දෙමිනි. මෙයින් ඇති වූ තුවාල, වේදනා දරා ගනිමින් ඔවුන්ගේ ආදර සැම අද ද සිහිපත් කරමින් ජීවත් වන පවුලේ උදවිය මේ මීසමේ සිටිති. සුනාමි ඛේදවාචකය හේතුවෙන් දේවස්ථාන අවට ඔවුන්ගේ වාස භූමි අහිමි වී වෙනත් ස්ථානවලට ගොස් පදිංචි වීමට සිදු වී ඇත. මේ හේතුවෙන් වල් අලි සහ විෂඝෝර සර්පයන්ගෙන් බේරී දේවස්ථාන කරා පැමිණීමට විශේෂ ආයාසයක් දැරිය යුතුය.

පාසල් අධ්‍යාපනය, රෝහල් සහ සනීපාරක්ෂක කටයුතු, ස්ථිර රැකිරක්ෂා, නිවාස ගොඩනැගිලි පහසුකම් අවම මට්ටමක පවතින මේ මීසම ආත්මික, ශාරීරික සහ සමාජීය ප්‍රශ්න වලින් පිරි ජනතාව ඒවාට හිර වී සිටිය ද ඒවායින් එතෙර වී ගැලවීමක් අපේක්ෂා කරමින් සිටිති. පසුගිය වසරේ මාර්තු 3 වෙනිදා මීසම් සේවක පියතුමා ලෙස පත්වීම ලැබීම තුළ සලයිපෙයාරු, කුච්චවේලි, සාගරපුර, කල්ලරාව, වීරන්තිවු සහ ජින්නාපුර කතෝලික ජනතාව ආත්මිකව පෝෂණය කිරීමේ වගකීම මට පැවරී තිබේ. එඬේරකු වශයෙන් මාගේ කාර්යය වූයේ විසිරී සිටින මීසම් වාසීන් සහ සංචාරක දේව ජනතාව එකම අරමුණක් සඳහා එතෙර කිරීමයි. මේ සඳහා මට තිබුණු ප්‍රධානම මාර්ගය වූයේ ඉරුදින දිව්‍ය පූජාවයි. සෙනසුරාදා සවස දිව්‍ය පූජා දෙකක් ද ඉරුදින උදය වරුවේ දිව්‍ය පූජාවන් තුනක් ද පවත්වන්නේ දෙවියන් වහන්සේගෙන්ම ලද වරමිනි. තවද, දහම් පාසල් දෙකක් කල්ලරාව සහ සාගරපුර සතියේ දිනවල ශු. අන්තෝනි සහ ශු. සෙබස්තියන් දේවස්ථාන වල නුවාන පූජා, කුඩා සංඝවල හා නිවෙස් වාඩිවල දිව්‍ය පූජා පවත්වමින් ජනතාව අතර ගැවසෙමින් එකම මීසම් පවුලක සම්බන්ධතාව ගොඩනගා ගැනීමට මට හැකි විය. සෙනසුරාදා උදය වරුවේ සර්වාගමික ළමුන් සඳහා පැවැත් වූ ඉංග්‍රීසි පන්තිය සහ ළ. ක්‍රි. වි. සමිතිය, සහරාන් ඇතුළු පිරිස එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය හේතුවෙන් වැනසී ගියේ ය. සර්වාගමික දරුවන් සහ ඔවුන්ගේ දෙමාපියන් ගොඩනගාගෙන තිබූ විශ්වාසය එයින් බිඳ වැටී ගිය අතර, යලි එය යථා තත්ත්වයට පත්වීමට බොහෝ කාලයක් ගත වනු ඇත. එනමුත් කතෝලික සභාව මනාව අවබෝධ කරගත් එහි ආශිර්වාදය තම පවුලට ලබාගත් මුස්ලිම්, හින්දු සහ බෞද්ධ සුළු පිරිසක් අප සමඟ තවමත් අත්වැල් බැඳගෙන ඇත. ඔවුන්ට පසුගිය නත්තලේ දී සහ අලුත් අවුරුද්දේ දී කියන්නට බැරි තරම් දේව ආශිර්වාදය ලැබිණ.

අප දරුවන්ට නැවතත් දහම් පාසල් සහ ඉංග්‍රීසි දැනුම දෙන ලෙස දෙමාපියන් කළ ඉල්ලීම නිසා මෙම වසරේ මුල සිට තම පැවිදි දිවියේ ශ්‍රී ලාංකික අත්දැකීම එකතු කර ගැනීමට ඉන්දුනීසියාවේ සිට මෙහි පැමිණ සිටින ගරු එඩ්වින්ස් නි. ම. නි. සහෝදරතුමන්ද සතියේ සඳුදා, බදාදා සහ සිකුරාදා සවස් කාලයේ මීසමේ දරුවන්

සඳහා ඉංග්‍රීසි පන්ති පවත්වා ඉංග්‍රීසි කතා කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙයි. හැම පළමු සිකුරාදා දින සවස 3.00 ට දිව්‍ය පූජාව පවත්වා ඉන් අනතුරුව සත්ප්‍රසාද වහන්සේ වැඩම කර ජනතාව යාච්ඤාවේ නිරත වන අතර, කැමති අයට හොඳ පාපෝච්චාරණයක් කර ගන්නට අවස්ථාව සලසා ඇත. විවිධ ප්‍රශ්න වලට සිර වී සිටින ජනතාවට උපදේශනය තුළින් ඒවා ගැඹුරින් සාකච්ඡා කර එම ප්‍රශ්න හොඳින් තේරුම් ගෙන, ඒවාට ඔවුන්ට ගත හැකි හොඳම සහ නිවැරදිම විසඳුම් ලබා ගැනීමට ද අවකාශය සලසා ඇත.

මීසමේ වෙසෙන සියලුම දරුවන්ට ද අප සමඟ සමීපව සිටින සර්වාගමික දරුවන්ට ද 2020 වසරට අවශ්‍ය ශිෂ්‍ය ආධාර, පොත්පත්, නිල ඇඳුම්, පාසල් උපකරණ, බෑග් සහ සපත්තු මෙවර නත්තලේ දී දීමට අපට හැකි වුණේ නිර්ලෝභී ජනතාවකගේ මැදිහත් වීමෙනි. මෙය මෙවර නත්තලේ දී සහ අලුත් අවුරුද්දේ දී අප මීසමේ පවුල් අතර සමගිය වර්ධනය කිරීමට සමත් වූයේ පවුලේ අගහිඟකම්, ප්‍රශ්නවලට කදිම උදව්වක් මේ තුළින් ලැබුනු නිසා ය. තවද, දිළිඳු අසරණ පවුලකට නිවසේ හදාගැනීමට නොහැකි වූ කොටස සකස් කර ගැනීමට උදව් උපකාර කරන ලදී. ඒ සඳහා අප පදවි එඬේරාණන් වන අති උතුම් නොයෙල් එම්මැනුවෙල් රාජගුරුතුමන්ගේ ආශිර්වාදය ද මේ අසරණ පවුල බැහැදැක ඔවුනට දෙන ලදී. **කුච්චවේලි මීසම තුළ දේව ආදරය, මඟ පෙන්වීම ප්‍රකාශ කරන තවත් බොහෝ දෑ සිදුවෙමින් පවතින අතර, මේ වන විටද අප දේව ජනතාව ඔවුන් සිටි ස්ථානයෙන් පියවර ගණනාවක් ඉදිරියට ගොස් ඇත. එතෙරවීමකට ලක් වී ඇත.** අප ස්වාමිදරුවන් අපට දෙන්නා වූ ශුභාරංචියෙන් ද, ශු. සභා මාතාවගේ මැදහත්කමින් ද නිර්මල මරිය නිකායේ නිර්මාතෘ ශු. එවුජින් ද මැසනොද් තුමන්ගේ මඟපෙන්වීම තුළ, **පළමුව මිනිසුන්ට මිනිසුන් ලෙස ජීවත් වීමට අප මඟ පෙන්විය යුතු ය දෙවනුව කිතුනුවන් ලෙස ජීවත්වීමට අප ඔවුන්ව මෙහෙය විය යුතුය අවසානයේ දී ඔවුන් සාන්තුවරයන් වීම පිණිස අප ඔවුනට උදවු කළ යුතු ය යන දැක්ම තුළ** අප මීසමේ දේව ජනතාව ද නිර්මල මරිය නිකායික

මීසම් සේවාව කරනකොට ගෙන ජීවිතයේ විවිධ වහල් භාවයන්ගෙන් මිදී අලුත් ජීවිතයක පැවැත්මකට එතෙර වේවා යැයි ද, දිනක සදාතන ගැලවීම ලබා ස්වර්ග රාජ්‍යය කරා සැපත් වේවා යැයි ද, ප්‍රාර්ථනා කරමු.

**ගරු සුභාෂ් ප්‍රනාන්දු නි. ම. නි. පියතුමා,**
**මීසම් සේවක,**
**කුච්චවේලි.**

22 වන පිටුවෙන්.....

අන්තිම රාත්‍රී භෝජන පසුබිම තුළ උන්වහන්සේ "දිව්‍යසත්ප්‍රසාදය" ස්ථාපිත කළ බව අපි දනිමු. එනමුත් පාද ධෝවනය කිරීමේ සිදුවීම ඔස්සේ වඩා ඉස්මතු වනුයේ දිව්‍ය සත්ප්‍රසාදයට වඩා ප්‍රසාද ස්නාපනය නමැති සක්‍රමේන්තු ස්පර්ශවීම විශේෂත්වයකි. ප්‍රසාද ස්නාපනය හෙවත් බව්තිස්මය මගින් කිතු සමිඳාණන්ගේ අනුගාමිකයකු / ශ්‍රාවකයකු වීමට කැඳවීමක් ලැබ ඇති හැම කෙනෙක්ටම ප්‍රේමයේ ඇරයුමේ දැතද යොමුවන බව කිසිසේත්ම අමතක කළ නොහැකිය. තවද, " පාද ධෝවනය" ප්‍රේමයේ ඇරයුමකි. අන් අයගේ ශුභසිද්ධිය / යහපත වෙනුවෙන් වැයවීමට, කැපවීමට ලද විශේෂ ආරාධනයකි. මේ කැපවීම සත්ප්‍රසාදීය ජනතාවක් වීමේ දී වඩ වඩා සවිමත් වන බවද මෙහිදී සඳහන් කළ යුතුය. එනිසා මහ බ්‍රහස්පතින්දා දිව්‍ය පූජාව තුළ දිස්වන "පාද ධෝවනය කිරීම" නැවත මෙම සංකේතාත්මක ක්‍රියාව කිතුනු අප මූලික කැඳවීම වන බව්තිස්මය හා සමීපව බද්ධව පවතින බව පැහැදිලිය.

**ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමා,**
**මීසම් සේවක,**
**කලමුල්ල,**
**කළුතර.**

# අපේ ඇත්තෝ

ඕකා පර සුද්දා යයි
සිංහලයෝ පර සුද්දන් හා
ඇණ කොටා ගත්හ.

ඕකා දෙමළා යයි
සිංහලයෝ දෙමළුන් හා
ඇණ කොටා ගත්හ.


ඕකා යූඑන්පී කාරයා යයි
ඕකා ශ්‍රී ලංකා කාරයා යයි
සිංහලයෝ සිංහලයින් හා
ඇණ කොටා ගත්හ.

දෙපැත්තෙන්ම තුවාල කාරයෝ
ඉස්පිරිතාලයට ගියහ.
ඉක්බිති සියල්ලෝම
දෙමළ දොස්තරවරයකුගෙන්
ප්‍රතිකාර ලැබ
පර සුද්දා හැදූ බෙහෙත්
තුවාළ වලට දා ගත්හ.

**ප්‍රේමකීර්ති ද අල්විස්**

---

"මෙවන් ගෝත්‍රවාදී
පිල් බෙදීම් වලට කොටු වී
වහල්කමේ ආකල්ප වලින්
ගැලවී එතෙර වන්නට
පාස්කුව ආරාධනා
නොකරයි ද?"




## ප්‍රහේලිකා අංක 56 ජයග්‍රාහකයෝ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ව | ති | කා | නු | 2 ව | | 3 ගි | හි |
| ං | | | | 4 ස | ත | ර | |
| සෙ | | 5 ද | | | | 6 ය | ස |
| | | ළ | | 7 සි | ත | | |
| 8 ජ | යෝ | දා | | ති | | 9 සී | 10 නී |
| නා | | | 11 ක | ය | | සී | ය |
| ධි | | 12 නි | | 13 ම | ක් | ක | ම |
| ප | | වි | | | | ඩ | |
| 14 ති | ම | ති | | 15 ර | ට | | |

- **පළමුවන ස්ථානය** - වින්දන සාවින්ද
  11 ශ්‍රේණිය, බප/පිළි/ රෝමානු කතෝලික විදුහල, රාවතාවත්ත, මොරටුව.
- **දෙවන ස්ථානය** - ඩබ්. තිළිණි සෙව්වන්දි පෙරේරා
  10 ශ්‍රේණිය, හලා/ කාර්මෙල් බාලිකා මධ්‍ය මහා විද්‍යාලය, හලාවත.
- **තෙවන ස්ථානය** - ජ්. කේ. ජයමිණි සෙව්වන්දි
  11 ශ්‍රේණිය, බප/හෝ/ කඩුගොඩ කණිෂ්ඨ විදුහල, වග.

# නිදහස් අහසක් නිදහස් පොළවක්

ශුද්ධ වූ බයිබලය ඇරඹෙන්නේ දෙවියන් වහන්සේ අහස හා පොළව මැවීම ගැන කතාවෙනි. එසේත් නැත්නම් විශ්වයේ ආරම්භය ගැන කතාන්දරයකිනි.

**"දෙවියන් වහන්සේ අහස හා පොළව මවන විට" (උත්පත්ති 2/4).**

ශුද්ධ වු බයිබලය නිමාවන්නේ දෙවියන් වහන්සේ අලුත් අහසක් අලුත් පොළවක් උදා කිරීම පිළිබඳ කතාවෙනි. එසේත් නැත්නම් විශ්වයේ පූර්ණත්වය පිළිබඳ කතාන්දරයකිනි.

**"ඉන්පසු මම අලුත් අහසක්ද අලුත් පොළවක් දිටිමි" (එළිදරව්ව 21/1).**

දෙවියන් වහන්සේ මැවූ අහස හා පොළව, විශ්වය මනහර බව උන්වහන්සේ දුටු සේකැයි උත්පත්ති පොත තව දුරටත් අපට පෙන්වා දෙයි. මැවිල්ල අදූෂිත සුන්දර එකකි.

එහෙත් මිනිසා ඒ මැවිල්ල දූෂණයට ලක් කර ඇත. විශේෂයෙන් මිනිසා ජීවත්වන පෘථිවියේ භූමිය, ගොඩබිම දූෂණයටද, මුහුද හා ගංගා ජල දූෂණයටද, අහස වායු දූෂණයටද ලක් වී ඇත.



අද පෘථිවියම කැළි කසළින්, විස දුමින්, අපද්‍රව්‍යයෙන්, වසවිසෙන් පිරී ඇත. ඒ පෘථිවි මාතාව ඒවායින් නිදහස් කරන තුරු මිනිසාගේ නිදහස අර්ථවත් නොවේ. මිනිසා බහුභාණ්ඩික වෙළඳ පොළ සමාජ ආර්ථික ක්‍රමයට වහල්වී තමා තුළ සැඟවී ඇති තෘෂ්ණාවට යටපත් වී තමාව මෙන්ම පෘථිවියද අනතුරේ හෙළා ඇත.

මිනිසා තේරුම්ගත යුතු වැදගත්ම යථාර්ථය වන්නේ මිනිසාට සොබාදහමින් තොරව ජීවත් විය නොහැකි බව හා දැනට මිනිසාට ජීවත්වීමට හැකි විකල්ප පෘථිවියක්, ග්‍රහලෝකයක් නැති බවයි.

තෙවන සහස්‍රයේ, තෙවන දශකය උදාවන්නේ කාලගුණික හදිසි තත්ත්වයක් (Climate Emergency) උද්ගතව තිබෙන පසුබිමකය. ශ්‍රී ලංකාවද තිබෙන්නේ ලෝකයේ කාලගුණික අවදානම් ඉහළම රටවල් තුන අතරය.

එහෙත් අවසනාවකට ලෝකයේ මෙන්ම අප රටේද බහුතර ජනයා මේ අති භයානක හදිසි තත්ත්වය තේරුම් ගෙන නැත. ඒ වෙනුවට සැබෑ ප්‍රශ්න නොවන ජාතිය ආගම පිළිබඳ ව්‍යාජ ප්‍රශ්නවල පැටලී සිටිති.

එහෙත් අප මතක තබා ගත යුත්තේ අපේ ජාතිය නිසා හෝ අපේ ආගම නිසා අප කෙරහි වායු දූෂණය, ජල දූෂණය, පරිසර දූෂණය, ශබ්ද දූෂණය, සාගර දූෂණය බල නොපා සිටින්නේ නැති බවයි.

**මහින්ද නාමල්**

# ඕං එහෙනං



නත්තල් ආවා අවුරුදු කැවා කාලය ටික ටික ඉගිල ගියා
මේ තෙර පසු කොට ඒ තෙර වන්නට කාලය ඇවිදින් මතකෙ තියා
කුරුස කරට ගෙන අළු තවරා ගෙන මෙතෙරින් එතෙරට යන්න ගියා
චාරික චතරික චාරික යන්නට නඩයක් සොයමින් ඇවිද ගියා

දිව්‍ය හෘදයයි මරිය හටයනුයි තරුණ සමිතියත් එකතු වුණා
මරණාධාරෙයි සමඟ විසෙන්තිය ඒකක නායක හවුල් වුණා
ගාන පියවුණා වාහනෙ පිරුණා කාල වෙලාවල් නියම වුණා
බැනර් ගසාගෙන දෙවියන් වැඩගෙන බත් ගෙඩි බැඳගෙන පිටත් වුණා

කොන්තෙ කියැවෙනා, කය දුෂ්කාරය ලතෝනි ගී හඬ පැතිරෙන්නා
භක්තිය ඉහළයි ගමනත් පහසුයි කල්වරි පුදබිම ළං වෙන්නා
කොල්ලො කෙල්ලො ටික ෆෝන් කොටනකොට මරිය හටයො රවනා බලනා
පුරුෂ පක්ෂයේ සමහර කට්ටිය සෙට් වෙන්නට තැන් තැන් සොයනා

කොහොම කොහොම හරි ගමන නිමවුණා ගමේ කතාබහ පැතිරෙන්නා
සල්ලිත් අරගෙන කෑම හරි නැතැයි සමහරු දෝසා කියවන්නා
කෙල්ලො කොල්ලො ටික නටපු නැටිල්ලට වයසක උදවිය දෙහිකපනා
සෙට්වුණු කට්ටිය සිංදු කියපු එක කතාබහට වැඩි ලක්වන්නා

පාදනමස්කාරය වටේම ගමවට යන්නට දිනයක් නියම වුණා
කුරුස සිටවුණා පීකර් බැන්දා බරවූ කුරුසිය කරට ගෙනා
එක්වරු රැකෙනා ගොඩමස් නොකනා නළලේ අළු තවරා ගන්නා
දවල් මිගෙල් වී රෑ දනියල් වන චරිතය නියමෙට රඟ දෙන්නා

ඒ තෙර වී ගැලවෙන්නට කිව්වට මේ තෙර රැදෙන්න සිත දෙන්නා
චතාරිකයෙ මොන පිළිවෙත් කෙරුවත් අපි තුළ වෙනසක් ඇති නොවෙනා
නත්තල් පාස්කු මුනි බැති සමරන නමට කිතුනුවන් වී ඉන්නා
සුදු හුණු තවරපු සොහොන් කොත් වගේ ඇතුළත කුණු වී ගඳ ගසනා

**සූරිය මාමා - ජෝසප් ඩයස්**

# කතෝලික ධර්මය
## අ.පො.ස ( සා/පෙළ ) විභාගය - 2020
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස

❍ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

**i.** 1. දේව දරුවකු වීම සහ නව ජීවනය ශක්තිමත් කිරීම සඳහා කැඳවීම ලබන ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
2. ශුද්ධවූ පාවුලු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.
3. ආදි පීතෘ ජාකොබ්ගේ පුත් ජෝසප් පොතිපර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩ වන පණත් දෙක මොනවාද?
4. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කර ගත් ගිවිසුමේ අඩංගු ප්‍රධාන කරුණු දෙක මොනවාද?
5. පුරාණ ගිවිසුමට අනුව යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක සඳහන් කරන්න.
6. මනස්තාපයේ ආකාර දෙක සඳහන් කරන්න.
7. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත අයත් අනුකොටස් දෙක නම් කරන්න.
8. ශුද්ධවූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමන සඳහා අතරමඟදී සහභාගී කරගත් පුද්ගලයෝ දෙදෙන කවුරුද?
9. පංච පුස්තකය සකස් වී ඇත්තේ කුමන කරුණු දෙකක් පදනම් කරගෙනද?
10. ස්නාවක ජොහාන් තුමාගේ උත්පත්තියෙන් දින අටකට පසු සිදු කළ චාරිත්‍ර දෙකක් සඳහන් කරන්න.

**ii.** 1. ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයින්ට ඉගැන්වූ යාච්ඤාව සහ ගෝලයින් වෙනුවෙන් කළ යාච්ඤාව නම් කරන්න.
2. ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව තුළ යාච්ඤා කළ යුතු ආකාරය ගැබ් වී ඇති බවට සාධක තුනක් ඉදිරිපත් කරන්න.
3. කිතුනු සිසුවෙකු ලෙස ඔබේ ජීවිතයට පැමිණෙන දුර්පරීක්ෂාවලින් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා දෙවි පියාණන් ඉදිරියේ ඔබ කරණ යාච්ඤාවක් ලියන්න.

**iii.** 1. ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා රචනා කළ පොත් දෙකක් නම් කරන්න.
2. ශුද්ධ වූ ජුසේ වාස් මුණිතුමා සිදු කළ ප්‍රාතිහාර්ය තුනක් ලියන්න.
3. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශය පාලනය කළ අවධියේ කතෝලිකයනට මුහුණ පෑමට සිදු වූ බාධක පහක් ඇසුරින් විස්තර කරන්න.

**iv.** 1. ද්වීතීය පාවුලු සන්දේශ දෙක නම් කරන්න.
2. ධර්මදූත චාරිකාවලදී ශුද්ධවූ පාවුලු තුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් සඳහන් කරන්න.
3. ශුද්ධවූ පාවුලු තුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

**v.** 1. ලේඛක දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
2. දිවැස්වැකි කීමේදී දිවැසිවරුන් භාවිත කරන තුන් ආකාර පද මාලාව සඳහන් කරන්න.
3. ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලැබූ දිවැසිවර කැඳවීමට සාක්ෂි දරන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න.

**පිළිතුරු**

**i.** 1. දේව දරුවකු වීම - ප්‍රසාද ස්නාපනය.
තම ජීවිතය ශක්තිමත් කිරීම - අභිවෘද්ධි ආලේපය.
2. කාර්ය බහුලත්ව නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව.
සිරස්ගතව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව.
3. හය වන පනත - කාමමිථ්‍යාචාරය නොකරව.
නවවන පනත - පරදාර ආලය නොකරව.
4. අසංඛ්‍ය වූ දරු පරපුරක් දීම.
සඳහටම හිමි වන දේශයක් දීම.
5. පව්වලට වන්දි ගෙවීම සඳහා.
දෙවියන් වහන්සේ සමඟ යහපත් හා අඛණ්ඩ සම්බන්ධයක් පවත්වා ගැනීම සඳහා.
6. දයාධික මනස්තාපය.
භයාධික මනස්තාපය.
7. පඬුරු පෙරහැර හා පඬුරු පිදීම.
පඬුරු මහ යැදුම.
8. තිමෝතියස් තුමා
ලූක් තුමා
9. පරම්පරාගත විශ්වාසය
අත්දැකීම්
10. චර්මච්ඡේදන පිළිවෙත සිදු කිරීම.
නම තැබීම.

**ii.** 1. ස්වාමිවාක් ආරාධනාව / උත්තම පූජක යාච්ඤාව
2. පියාණනී යනුවෙන් ආමන්ත්‍රණය කිරීම සහ දේව ප්‍රශංසාව ඇතුළත් වීම.
වරදට කමාව යැදීම.
ඉල්ලීම් ඉදිරිපත් කිරීම.
දේව ආරක්ෂාවට භාර වීම.

3. සිසු අදහස්

**iii.** 1. දේව වේද පුරාණය/ වේද කාව්‍ය / පසන් පොත/ මංගල ගීතය / දේව නීති විසර්ජනය/ ආනන්ද කලිප්පුව / දුක්ප්‍රාප්ති ප්‍රසංගය.

2. දැඩි නියගයක්දී මහනුවර රාජධානියට වැස්ස ලබා දීම.
දැඳුරු ඔයෙන් පාගමනින් එතෙර වීම.
තනි අලියෙකු මෙල්ල කිරීම.

3. මෙරට ජීවත් වූ සියලුම කතෝලික පියවරුන් රටින් පිටුවහල් කෙරිණි.
කතෝලික දහම ඇදහීම තහනම් විය.
දිව්‍ය පූජාවද පැවැත්වීම තහනම් විය.
කතෝලික දෙව් මැදුරු, පාසල් හා පුණ්‍ය ආයතන, රෙපරමාදු පූජකයන්ට පවරා දුන් අතර, සමහර ආයතන විනාශ කෙරිණි.
කතෝලිකයන්ට කිසිදු පූජකයෙකු නොමැති වීම.

**iv.** 1. එපීස/ කොලොස්සි

2. සිරගත කරනු ලැබීම.
ගල්ගසා නගරයෙන් පිටතට ඇද දැමීම.
ජුදයන්ගේ විරෝධයට ලක් වීම.

3. ජීවිත තර්ජන මැද පවා දහම් සේවාවේ යෙදීම.
දේව වචනයට තම ජීවිතාදර්ශයෙන්ම සාක්ෂි දැරීම.
කිතුනු යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටුකිරීමට යොමුවීම.
බාධක හිරිහැර මැද පවා තම විශ්වාසය රැක ගැනීමට කටයුතු කිරීම.
ජීවමාන ක්‍රිස්තුස් වහන්සේව හඳුනා ගනිමින් අන්‍යයන්ට ද උන්වහන්සේ හඳුන්වා දීමට කටයුතු කිරීම.

**v.** 1. ප්‍රධාන දිවැසිවරු/ සුළු දිවැසිවරු

2. "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක".
"මෙසේ වදාරණ්නේ සමිඳාණන් වන මමය".
"සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ....... වෙත පැමිණියේය".

3. සිසු අදහස්

---

**ඉදිරිපත් කිරීම :- ජේ. ඒ. එල්. එම්. ශ්‍රිමතී සිල්වා මෙනවිය.**
ආචාරිනී : මිනුවන්ගොඩ / ශ්‍රී ඥානෝදය ම.ම.වි. දිවුලපිටිය.

# ලක්දිව ක්‍රිස්තු ශාසනය ( VIII )

**අ.පො.ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය - ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.**

## ඕලන්ද පාලන සමය

**කලා ශිල්ප දියුණුවීම :**

ඔරතෝරියානු පියවරුන්ගෙන් මෙන්ම ඕලන්ද දේවගැති වරුන්ගෙන් ද නව නිර්මාණ බිහි විය. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා කතෝලික පොත පත රචනා කර ඇත. එසේම ලන්දේසි දේවගැතිවරු ක්‍රි. ව. 1737 දී ප්‍රථම සිංහල මුද්‍රිත පොත නිකුත් කළහ. ඒ කෘතියේ අකුරු තරමක් විශාලය. එහි අන්තර්ගතයේ ස්වාමිවාක් ආරාධනාව, උදේ සවස යාච්ඤා, අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ ඇදහිලි 12 සහ දස පනත ද අඩංගු විය. එසේම ලන්දේසි දේව ගැතිවරුන් සම්පූර්ණ නව ගිවිසුම හා පුරාණ ගිවිසුමේ කොටසක් හෙළ බසට පරිවර්තනය කළහ. ක්‍රි. ව. 1739 දී සුබාරංචි පොත් 4 සිංහල බසින් මුද්‍රණය විය. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගෙන් සංගීත ක්ෂේත්‍රයට එක් වූ කලා නිර්මාණ බොහෝය. ලතෝනි, පසන් ගායනා, කිතුනු බැති ගී. නාට්‍ය, පැරණි නාඩගම් කලාව යනාදිය පෙන්වා දිය හැකිය. එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන් ද මනමේ නාටකයේ "ප්‍රේමයෙන් මන රංජිත වේ" ගීතය ජාකෝමේ පියතුමාගේ "ආරම්භෙන් පෙර නිර්මිත මනු ලොව" කිතුනු ගීතයේ තාලයට අනුව සකස් කර ඇත.

**ආගමික නිදහස කරා ගමන් කිරීම :**

ක්‍රි. ව. 1748 පමණ වන විට කන්ද උඩරට රාජ්‍යය හා ලන්දේසීන් අතර උග්‍ර ගැටුම් ඇති විය. මේ ගැටුම්වලට හේතු වූයේ කුරුඳු, ඇත්දළ හා මුතු බෙල්ලන් වෙළඳාම ය. ඒ යුද්ධ තත්ත්වය කිතු සසුනට නිදහස කරා පිය නගන්නට අවස්ථාවක් විය. එලෙසින්ම ඒ ගැටුම නිසා ඕලන්ද රජයේ කතෝලික පීඩනය කෙමෙන් තුනී වී ගියේය. පෘතුගීසි ආධිපත්‍යය ඉන්දියාවේ අවට ප්‍රදේශවලින් බැහැර වීම හේතුවෙන් නැවත පෘතුගීසි ආක්‍රමණයක් සිදු නොවනු ඇතැයි ලන්දේසීහු බලාපොරොත්තු වූහ. මේ කාලය වන විට ඉංග්‍රීසීන්ද අවට මුහුදේ බල සම්පන්න වීම හේතුවෙන් ලන්දේසීන් හට ස්වදේශිකයන් දිනා ගැනීමේ හේතුවක් ඇති විය.

මේ හේතුව නිසා ඕලන්ද රජයේ අවසාන කාලයේ කතෝලිකයන්ට යම් නිදහසක් ප්‍රදානය කර තිබුණි. දෙව් මැදුරුවල පූජා ඔප්පු කිරීමට හැකි විය. කෙසේ වෙතත් ලන්දේසි යුගයේ අවසාන වසරේ (1795) පූජාප්‍රසාදි තුමන්ලා 16 දෙනෙකු ලක්දිව සේවයේ යෙදී සිට ඇත.

## බ්‍රිතාන්‍ය පාලන සමය

**මුහුදු බඩ පළාත් බ්‍රිතාන්‍යයන් යටතට පත්වීම:**

ක්‍රි. ව. 1795 සිට ලක්දිව ඕලන්ද බලකොටු එකින් එක ඉංග්‍රීසින් අතට පත්විය. ක්‍රි. ව. 1795 පෙබරවාරි මස 16 වන දින කොළඹ කොටුව ද ඕලන්දවරුන් පන්නා දමා ඉංග්‍රීසීන් යටත් කර ගන්නා ලදී. ඒ අනුව ක්‍රි. ව. 1796 සිට 1948 දක්වා බ්‍රිතාන්‍ය පාලනය යටතට පත්විය. බ්‍රිතාන්‍ය ජාතිකයන්ට ඕලන්දයන් පලවා හැරීමට රුකුලක් වූයේ ක්‍රි. ව. 1789 දී යුරෝපයේ හටගත් ප්‍රංශ විප්ලවයයි. ප්‍රංශයේ කටයුතු ඕලන්දය වෙත දැඩිව බලපෑවේය. ඉන් සිදුවූයේ ඕලන්දය තමන් සතු යටත් විජිත බ්‍රිතාන්‍යට පැවරීමයි. බ්‍රිතාන්‍යවරුද තම බ්‍රිතාන්‍ය ඉන්දීය පෙරදිග වෙළඳ සමාගම මගින් යටත්විජිතකරණයේ යෙදුණහ. ක්‍රි.ව. 1815 වන විට මුළු ලක්දිව ඉංග්‍රීසීන් අතට පත් විය. බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී ලක්දිව කිතු සසුනට ආගමික නිදහස හිමි විය. ඒ යුගයේ දී තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරතුමා විසින් ආගමික නිදහස ප්‍රදානය කරන ලදී. ඉන්පසුව පත් වූ ෆෙඩ්‍රික් නෝත් ආණ්ඩුකාරතුමා ක්‍රි.ව. 1806 මැයි 27 වන දින "මැග්නා කාර්ටා" ආඥාපණතින් ලන්දේසින් විසින් පනවන ලද තහනම් නියෝග අහෝසි කළේ ය.

**ලක්දිවට පැමිණි විදේශීය ධර්මදූතවරු:**

ලක්දිව කිතු සසුනට නිදහස හිමි වීමත් සමඟ විදේශීය මිෂනාරිවරු මෙහි පැමිණියහ. ඒවන විටත් ලක්දිව ඕලන්ද රෙපරමාදු සභාවේ කටයුතු සහ කතෝලික සභාවේ කටයුතු සිදු වෙමින් පැවතිණි. ලක්දිව බ්‍රිතාන්‍යන්ට යටත් වීමත් සමඟ ඇංග්ලිකානු සභාවේ කටයුතු සඳහා ද මිෂනාරිවරු පැමිණියහ. ඒ අනුව ලක්දිව පැමිණි මිෂනාරි කණ්ඩායම් කිහිපයකි.

1. ක්‍රි. ව. 1805 ලන්ඩන් ධර්මදූත කණ්ඩායම (ඇංග්ලිකානු සභාව)

2. ක්‍රි. ව. 1812 බැප්ටිස්ට් ධර්මදූත කණ්ඩායම (බැප්ටිස්ට් සංගමය)
3. ක්‍රි. ව. 1814 වෙස්ලියානු ධර්මදූත කණ්ඩායම (මෙතෝදිස්ත සභාව)
4. ක්‍රි. ව. 1816 ඇමෙරිකානු ධර්මදූත කණ්ඩායම
5. ක්‍රි. ව. 1818 සභා ධර්මදූත කණ්ඩායම (සී.එම්. එස්.)
6. ක්‍රි. ව. 1883 ගැලවීමේ හමුදාව (සැල්වේෂන් ආමි)

**මෙම මිෂනාරි වරුන්ගේ සේවාවන් අතර පොදු කාරණා හතරකි**

1. ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා පාසල් ආරම්භ කිරීම.
2. ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා සංචාරයේ යෙදීම.
3. රෝගී වූවන් සඳහා ඇප උපස්ථාන කිරීම.
4. දිළිඳු සහනාධාර කටයුතු සහ දයාවේ සේවා.

**මෙම සභාවන් 6 පොදුවේ පිළිගන්නා ලද්දේ සක්‍රමේන්තු 2 කි.**

1. බව්තිස්ම ස්නාපනය
2. ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය

**ලන්ඩන් ධර්මදූත සංගමය**

ක්‍රි. ව. 1533 එංගලන්ත පාර්ලිමේන්තුව මගින් පණතක් සම්මතකර ඇංග්ලිකානු සභාවේ නායකත්වය බලයට පත්වන රජුට පවරා සභාව ආරම්භ විය. 1559 දි එලිසබෙත් රැජින විසින් ව්‍යවස්ථානුකූලව සභාව ඉදිරියට ගෙන යන ලදී. මේ සභාව එපිස්කෝපල් ව්‍යුහයේ සභාවකි. පිළිවෙත් හැම අතින්ම කතෝලික සභාවට සමානය. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ක්‍රි. ව. 1796 පමණ වන විට දේශීය පූජකවරුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ විය. වර්තමානය වන විට එංගලන්ත සභාව (ලංකා සභාව) ලෙස හඳුන්වයි. ඒ සභාව යටතේ පාලනය වන පාසල් කීපයකි. හිල්වුඩ්, ට්‍රිනිටි, මොවුබ්‍රේ, චුන්ඩිකුඩි ගර්ල්ස් ස්කූල්, බිෂොප් කොලේජ්, ලේඩිස් කොලේජ් වැනි පාසල් වේ. මේ වන විට ලංකා සභාවේ දියෝකිසි 2 ක් අප දේශයේ පිහිටා ඇත. 1. කොළඹ දියෝකිසිය 2. කුරුණෑගල දියෝකිසිය.

**බැප්ටිස්ට් ධර්මදූත සංගමය**

ජෝන් ස්මිත් තුමා මේ නිකායේ නිර්මාතෘවරයා වේ. එතුමා බ්‍රිතාන්‍යයේ එංගලන්ත සභා දේවගැති තුමෙකි. බැප්ටිස්ට් සභාවේ ප්‍රධාන තැනක් දෙන්නේ පුද්ගල නිදහසටය. මේ අයගෙන් පසුව 1761 අගෝස්තු 17 දින උපත ලත් විලියම් කේරි තුමා ආසියාව වෙත බැප්ටිස්ට් නිකායේ දූත කටයුතු ගෙනාවේය. එතුමා සමඟ ජේම්ස් චේටර් තුමා මෙරටට පමිණ ඇත. මේ සභාවේ තිළිණයක් ලෙස ලක්දිවට සිංහල-ඉංග්‍රීසි, ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂ ලැබී ඇත. කේරි කොලීජිය ඒ නිකායේ පාසලකි.

**මෙතෝදිස්ත (වෙස්ලියන්) සභාව**

එංගලන්තයේ ජීවත් වූ ජෝන් වෙස්ලි දේවගැති තුමා මෙතෝදිස්ත සභාවේ නිර්මාතෘවරයා වේ. පසු කාලයේ දී සභා නායකත්වයට පත් වන්නේ තෝමස් කෝක් දේවගැති තුමා ය. ලක්දිවට පැමිණි වෙස්ලියානු නිකායේ මිෂනාරි සභාව ප්‍රථම වරට දිව්‍ය පූජාව පවත්වා ඇත්තේ ගාල්ල කොටුවේ පිහිටා ඇති ඕලන්ද රෙපරමාදු සභාවේ දේවස්ථානයේ ය. ඒ 1814 ජූලි මස 03 වන දින ය. එදින ඒ සභාව ලක්දිව ප්‍රථම දිව්‍ය පූජාව පවත්වා ඇතැයි සැලකේ. මේ නිකාය ද අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවලට සේවය කර ඇත. වර්තමානයේ ඔවුන් සතුව පාසල් දෙකක් ඇත. එනම් කොළඹ වෙස්ලි විද්‍යාලය හා කොල්ලුපිටියේ මෙතෝදිස්ත බාලිකා විද්‍යාලය.

**සභා ධර්මදූත සංගමය**

1815 සිට මේ සංගමය ඇංග්ලිකානු නිකාය (ලංකා සභාව) සමඟ එක්වී කටයුතු කර ඇත. එහෙත් වර්තමානයේ ඒ සභාව ආත්ම කේන්ද්‍රීය සභාවකි. ක්‍රියාකාරීත්වයෙන් තොරය. මුල් යුගයේ දී ඔවුන් සතුව මහනුවර හිල්වුඩ් විද්‍යාලය හා කොළඹ කාන්තා විදුහල අයත් වූවත් වර්තමානය වන විට ඒ පාසල් ලංකා සභාව විසින් පවත්වා ගෙන යනු ලබයි.

**ගැලවීමේ හමුදාව**

මෙතෝදිස්ත සභාවේ තරුණ දේවගැති තුමෙකු වූ විලියම් බූත් දේවගැතිතුමාගේ මූලිකත්වයෙන් 1865 ජූලි මස 2 දින ගැලවීමේ හමුදාව ආරම්භ විය. ආරම්භ වූයේ එංගලන්තයේ ය. එහෙත් මේ වන විට රටවල් රාශියක ව්‍යාප්ත වී ඇත. ශ්‍රී ලංකාවට ගැලවීමේ හමුදාවේ සේවය ස්ථාපිත වන්නේ 1883 ජනවාරි 26 වන දිනය. මේ සභාවේ සේවා අතර සමාජයේ ආර්ථිකව පීඩාවට පත්ව සිටින කොටස් වෙත දයාවේ සේවාව දීම ප්‍රධාන වේ.

**ඇමෙරිකානු ධර්මදූත සංගමය**


ලක්දිව උතුරු ප්‍රදේශයේ විශේෂයෙන් ආගමික ජනතාව අතර මෙම සංගමය සේවය කර ඇත. මේ නිකාය ප්‍රධාන වශයෙන් පාසල් අධ්‍යාපනයට මුල් තැනක් ලබා දී ඇත.

**සටහන - එස්. හේමාල් පෙරේරා**

# මිනිසුන් දිනන්නෝ

## සමාජ හා එඬේරික නවෝත්පාදකයින්

ශ්‍රී ලංකාවේ ධීවර ජන ජීවිතයේ සිදු වන වේගවත් පරිණාමය සහ ඊට බලපාන ප්‍රධාන කරුණු අධ්‍යයනයක් කරමින් ඔවුන්ගේ ජීවිත වඩා යහපත් තත්ත්වයකට ගෙන ඒම සඳහා නිර්මල මරිය නිකායික ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා සමාජීය, ආර්ථික සහ ආධ්‍යාත්මික වශයෙන් වසර ගණනාවක් ජ්වලිතව ළෙන්ගතුකමකින් සේවයේ නිරත වී ඇත. එම අත්දැකීම සහ එතුමනට උදවු කළ අනිකුත් ගිහි, පැවිදි, පූජක කිහිපදෙනකුගේ ප්‍රයත්න "Fishers of People" නමින් පියතුමා ලියන ලද ග්‍රන්ථයෙහි අඩංගු කර ඇත. ඒ කෘතිය"මිනිසුන් දිනන්නෝ" ලෙස ශූ. පවුලේ ගරු හියුබර්ට් මාරි පැවිදි සොහොයුරිය සිංහලට පරිවර්තනය කළා ය. මේ දූත මෙහෙවර සහ එහි අත්දැකීම් මෙලෙස ග්‍රන්ථයකට ගෙන ඒම වෙනුවෙන් "භක්ති ප්‍රබෝධන" සඟරාවේ අපි, ධීවර ජනතාව සමඟ එකතු වී එතුමනට අපගේ කෘතවේදිත්වය පුද කරමු.





ISBN 978-624-5107-01-8

**Published by**
**Rajabima Oblate Centre,**
519 / 16, Jyanthi Mawatha, Anuradhapura, SRI LANKA


© Emmanuel Fernando, O.M.I.


email: emma1938omi@gmail.com




msu management & science university

QS WORLD UNIVERSITY RANKINGS TOP 50 UNDER 50

QS WORLD UNIVERSITY RANKINGS 2020 TOP 541+



SCHOLARSHIPS AVAILABLE

## After O/L & A/L - Earn a World Ranked Diploma or Degree

**Diploma Programmes Leading to Bachelor (Hons) Degree Offered by MSI Through MSU Malaysia**

077 0777 880

APPLY TODAY!

MBA / MBBS Ph.D

BSc (Hons) Final Year Top Up MSI Colombo

MSI Diploma 16 Months

After O/Ls or A/Ls (Pending)

### School of Science

Diploma Leading to BSc (Hons) Degree
- Biomedical Science
- Forensic Science
- Nutrition Science

### School of Hospitality

Diploma Leading to BSc (Hons) Degree
- Hospitality & Tourism Management
- Event Management
- Leisure Outdoor & Adventure Management

### School of Business

Diploma Leading to BSc (Hons) Degree
- Business Management
- Human Capital Management
- Retail Management

### School of Computing

Diploma Leading to BSc (Hons) Degree
- Information Technology
- Business Computing
- Information Technology (Mobile & Wireless Technology)

ICHM International College of Hotel Management Est. 1992 ADELAIDE - AUSTRALIA

### Programmes Offered by MSU Malaysia

- MBA
- Ph.D
- MBBS

SLMC Sri Lanka Medical Council

APPROVED UGC RECOGNIZED

IBMS

TVEC

msi management & science institute

**Management & Science Institute**
No: 300, Galle Road, Colombo - 03, Sri Lanka
Tel : +94 112 576 900, +94 112 576 700
Mobile : +94 77 0777 880
Email : enquiry@msi.edu.lk

**Management & Science University**
University Drive, Off Persiaran Olahraga Section 13,
40100 Shah Alam, Selengor Darul Ehsan, Malaysia.
Tel : 603 5521 6868, 603 5511 2848
Email : enquiry@msu.edu.my

msi.colombo
msu.msi.colombo

www.msu.edu.my



"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. Q/D/03/පුවත්/2020